# 3. කෘෂිකර්මය, ධීවර සහ වන සම්පත්

## 3.1 නිෂ්පාදන උපනති

වසර පුරා පැතිරුණු ඉතා හිතකර කාලගුණික තත්ත්වයට ප්‍රධාන වගාවන් දක්වූ යහපත් ප්‍රතිචාරයත් සමග සමස්ත කෘෂිකාර්මික නිමැවුම 1999 වසර තුළදී සියයට 4.5 කින් වර්ධනය විය. නිෂ්පාදනය ඉහළ යාමට මෙන්ම ක්ෂේත්‍ර බෝග වගා කරන ලද බිම් ප්‍රමාණය ඉහළ නැංවීමටද හිතකර කාලගුණික තත්ත්වය හේතු විය. 1998 වසරේදී සියයට 20 කින් වර්ධනය වූ වී නිෂ්පාදනය 1999 වසරේදී සියයට 7 කින් තවදුරටත් ඉහළ යමින් මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 2.9 ක ඉහළම නිෂ්පාදන මට්ටමක් වාර්තා කරන ලදී. 1998 වසරේදී ඉහළම නිෂ්පාදන මට්ටමක් වාර්තා කල තේ අංශයද 1999 වසරේදී සියයට 1 ක වර්ධනයක් දක්වමින් කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 284 ක නව වාර්තාගත නිෂ්පාදන මට්ටමක් වාර්තා කරන ලදී. කෙසේ වෙතත්, තේ අපනයනයෙන් ඉහළ ආදයමක් ලබා ගැනීමට නොහැකි වූයේ රුසියානු අර්බුදය නිසා තේ මිල පහළ වැටීම සිදු වූ බැවිනි. රුසියානු ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම හා ඉන්දියාවේ සහ කෙන්යාවේ තේ නිෂ්පාදනය පහත වැටීමෙන් ඇති වූ ලෝක තේ නිෂ්පාදනයේ අඩු වීම නිසා 1999 වසර අග භාගයේදී තේ මිලෙහි වැඩි දියුණුවක් දක්නට ලැබිණි. පොල් නිෂ්පාදනයද 1999 වසර තුළදී සියයට 10 කින් වර්ධනය වී පොල් ගෙඩි දශ ලක්ෂ 2,808 ක් වූ අතර එය 1986 න් පසු වාර්තා වූ වැඩිම නිෂ්පාදන මට්ටම වේ. පසුගිය වසරේ පැවති හිතකර කාලගුණික තත්ත්වයේ පසුකාලීන බලපෑම මෙන්ම 1999 වසරේ පැවති මනාව පැතිරුණු වර්ෂාපතනය සහ පොහොර භාවිතය ඉහළ යාම පොල් නිෂ්පාදනයේ වර්ධනයට දයක විය. අනෙකුත් අපනයන බෝග අතුරෙන් කෝපි, කුරුඳු, කරාබුනැටි, කරදමුංගු, සාදික්කා, වසාවාසි සහ පැහිරි යනාදී බෝගවල නිෂ්පාදනයේ වැඩි වර්ධනයක් වාර්තා වී ඇත. අනෙකුත් ක්ෂේත්‍ර බෝග අතුරින් ලොකු ළූණු නිෂ්පාදනය තුන් ගුණයකින් වැඩි වූ අතර අර්තාපල් සහ කුරක්කන් නිෂ්පාදනය පිළිවෙලින් සියයට 5 කින් සහ සියයට 9 කින් වැඩි විය. මිරිස්, උඳු, තල සහ මුං නිෂ්පාදනය පසුගිය වසරට වඩා අඩු මට්ටමකින් පැවතිණි. 1999 වසරේ මත්ස්‍ය නිෂ්පාදනය සියයට 8 කින් වැඩි විය. මෙම වසරේදී සීනි සහ කුකුළු මස් නිෂ්පාදනයේද වැඩි දියුණුවක් පෙන්නුම් කරන ලදී.

**3.1 සංඛ්‍යා සටහන**
**ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදන සහ මිල වෙනස්වීම්**

| අයිතමය | ඒකකය | නිෂ්පාදනය | | වෙනස්වීමේ ප්‍රතිශතය 1998/99 | |
|---|---|---|---|---|---|
| | | 1998 | 1999 | නිෂ්පාදනය | මිල |
| තේ | කි.ග්‍රෑ.දශලක්ෂ | 280 | 284 | 1 | -14 |
| රබර් | කි.ග්‍රෑ.දශලක්ෂ | 96 | 97 | 1 | -9 |
| පොල් | ගෙඩි දශලක්ෂ | 2,552 | 2,808 | 10 | 12 |
| වී | මෙ.ටො.දහස් | 2,692 | 2,868 | 7 | 18 |
| සීනි | මෙ.ටො.දහස් | 61 | 65 | 7 | -12 |
| මත්ස්‍ය | මෙ.ටො.දහස් | 260 | 280 | 8 | -2 |

මූලයන් : අදාළ ආයතන
ශ්‍රී ලංකා මහ බැංකුව

## 3.2 කෘෂිකාර්මික ප්‍රතිපත්ති

කෘෂිකාර්මික බෝග සහ බීජ නිෂ්පාදන ක්‍රියාවලියෙන් රජය ක්‍රම ක්‍රමයෙන් ඉවතට යොමු වෙමින්ද, ව්‍යාප්ති සේවා කටයුතු සහ රක්ෂණ කටයුතු ලිහිල්කරණය කෙරෙමින්ද, ගොවියාගේ සුභසාධනය සහ ආරක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා වෙළඳපොළ මත පදනම් වුණු ක්‍රියාපටිපාටියන් වර්ධනය කෙරෙමින්ද වසර තුළදී පුළුල් කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් පවත්වාගෙන යන ලදී.

1996 දී නිවේදනය කරන ලද බීජ සහ රෝපන ද්‍රව්‍ය අංශය වාණිජකරණය කිරීමේ ජාතික බීජ ප්‍රතිපත්තිය අනුව යමින් බීජ පනත් කෙටුම්පතක් පිළියෙල කරමින් පවතින අතර එය ළඟදීම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ඇත. බීජ පනතේ අරමුණ වී ඇත්තේ ගුණාත්මක භාවයෙන් උසස් බීජ නිෂ්පාදනය සහ අලෙවිය වැඩි දියුණු කිරීමයි. මෙම කාර්යය සඳහා තීරු බද්දෙන් නිදහස්ව බීජ සහ රෝපන ද්‍රව්‍ය ආනයනය රජය මගින් දැනටමත් ආරම්භ කර ඇත. රට තුළ ගුණාත්මක තත්ත්වයෙන් උසස් බීජ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා මහඉලුප්පල්ලම, බතලගොඩ, අම්බලන්තොට, බටඅත සහ නිකවැරටිය ප්‍රදේශවල බීජ නිෂ්පාදන මධ්‍යස්ථාන ශක්තිමත් කිරීමට, රජය මගින් 1999 වසරේදී රුපියල් දශ ලක්ෂ 100 ක් ප්‍රදනය කරන ලදී. පෞද්ගලික අංශයද බීජ කර්මාන්තයේ වැදගත් කාර්යයක් ඉටු කෙරෙතැයි බලාපොරොත්තු වේ. රජය මගින් දැනටමත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් හිඟුරක්ගොඩ බීජ ගොවිපොල 1998 දී පෞද්ගලීකරණය කර ඇති අතර පැල්වෙහෙර බීජ ගොවිපොල පෞද්ගලීකරණය කිරීම සම්බන්ධයෙන් මූලික වැඩ කටයුතු අවසන් කර ඇත. පෞද්ගලීකරණය කරන ලද හිඟුරක්ගොඩ බීජ ගොවිපොල සාර්ථකව පවත්වාගෙන යන අතර පසුගිය මහ කන්නයේදී බිත්තර වී හිඟයක් නොපැවතීමෙන් එහි සතුටුදයක ප්‍රතිඵල සනාථ වේ.

කෘෂිකාර්මික රක්ෂණ කටයුතුවල අරමුණ පුළුල් කිරීම සඳහා කෘෂිකාර්මික සහ ගොවිජන සේවා පනත නමින් නව පනතක් මෙම වසර තුළදී නීතිගත කරන ලදී. මෙම නව පනත පැනවීමත් සමග පෙර පැවති කෘෂිකාර්මික රක්ෂණ මණ්ඩලය පුළුල් අරමුණක් සහිතව ප්‍රතිසංවිධානය කර කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ලෙස නම් කරන ලදී. මීට පෙර කෘෂිකාර්මික රක්ෂණ මණ්ඩලයේ ඒකාධිකාරියක්ව පැවැති බෝග රක්ෂණ කටයුතු සඳහා පෞද්ගලික රක්ෂණ සමාගම්වලටද සහභාගී වීමට මෙම නව පනත මගින් ඉඩ ලබා දී ඇත.

සේවාවක් ලෙස සම්පූර්ණයෙන්ම රජය මගින් නොමිලයේ ලබා දුන් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් 1999 වසරේදී ලිහිල්කරණය කරන ලදී. කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට මෙන්ම කෘෂිකාර්මික ව්‍යාප්ති කටයුතුවල

තරඟකාරිත්වය වැඩි කිරීමට ගාස්තු මත පදනම් වූ පෞද්ගලික ව්‍යාප්ති සේවාවක් ආසියානු සංවර්ධන බැංකු අරමුදලින් පාලනය වන දෙවන බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නියමු ව්‍යාපෘතියක් වශයෙන් මෙම වසර තුළ ආරම්භ කරන ලදී.

1995 වසරේ ආරම්භ කරන ලද රජයට අයත් වතු සමාගම් පෞද්ගලීකරණය කිරීමේ වැඩපිළිවෙල මෙම වසර තුළදීද තවදුරටත් ක්‍රියාත්මක විය. නමුණුකුල සහ තලවකැලේ වතු සමාගම් කොටස් වලින් ඉතිරි සියයට 20, කොළඹ කොටස් හුවමාරුව හරහා පොදු ජනතාවට විකිණීම මෙම වසර තුළදී සිදු කෙරිණි. වැවිලි කර්මාන්ත අංශයේ දිගුකාලීන පැවැත්ම සඳහා විශේෂ බලතල සහිත "රන් කොටස් හිමිකරු" (Golden Share Holder) වැවිලි සමාගම්වල ක්‍රියාකාරිත්වය සුපරීක්ෂාකාරීව අධීක්ෂණය කළයුතුය.

අසාර්ථක සහතික මිල ක්‍රමයක් සහිත වාතාවරණයක් යටතේ සාධාරණ මිලක් ලබා ගැනීමේදී සුළු ගොවීන් මුහුණ දෙන ප්‍රශ්නවලට පිළියමක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් දිස්ත්‍රික්ක කීපයක "ගොවි සහනය යෝජනා ක්‍රමය" යටතේ කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා ඉදිරි වෙළෙඳපොල ගිවිසුම් ක්‍රමයක් ආරම්භ කරන ලදී. ඉදිරි වෙළෙඳපොල ගිවිසුම මගින් ගොවීන් හා වෙළෙන්දන්ට අනාගත දින වකවානුවක් සඳහා කලින් නියම කර ගත් මිලකට කලින් නියම කර ගත් නිෂ්පාදිත ප්‍රමාණයක් මිලදී ගැනීම සඳහා ගිවිසුමකට එළඹීමට ඉඩ සැලසේ. ඉදිරි ගිවිසුම් මගින් ගොවීන්ට නිෂ්පාදන අලෙවි කිරීමේදී ඇති වන අවදානම ඉවත් කර ස්ථාවර මිලක් ලබා ගැනීමට ඉඩ සැලසේ. එමෙන්ම ස්ථාවර සැපයුමක් සහ මිලක් ලබා ගැනීමට හැකි වීම නිසා එය වෙළෙන්දන්ට සහ පාරිභෝගිකයන්ටද වාසිදායක වනු ඇත.

### විශේෂ සටහන 2

## කෘෂි නිෂ්පාදන සඳහා ඉදිරි විකුණුම් ගිවිසුම් : වෙළෙඳපොළ යන්ත්‍රණය තුළින් මිල ස්ථායීකරණය කිරීම

අවාරයේදී සහ බෝග නෙලන සමයේදී කෘෂි නිෂ්පාදනවල මිල ඉහළ පහළ යාම බොහෝ රටවල කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දැකිය හැකි ව්‍යවසනකාරී තත්ත්වයකි. වාරයේදී බහුල ලෙස සැපයෙන නිසා වෙළෙඳපොලෙහි තීරණය වන, මිල නිෂ්පාදන පිරිවැයටත් වඩා පහළ මට්ටමක පවතින බැවින්, කෘෂිකාර්මික කටයුතු අලාභදායී මෙන්ම අසාර්ථක ක්‍රියාවලියක් බවට පත් වේ. මෙයට ප්‍රතිවිරුද්ධ ලෙස, අවාරයේදී සැපයුම අඩුවන නිසා අධික ලෙස ඉහළ නගින මිල, එක් අතකින් කෘෂි නිෂ්පාදනවල ලාභදායිත්වය පිළිබඳව ගොවියන් නොමග යවන අතර, අනික් අතින් පාරිභෝගිකයන්ගේ ජීවන වියදම ඉහළ නංවයි. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල, ප්‍රධාන කෘෂි නිෂ්පාදනයන්හි මිල උච්චාවචනයවීම පහළ මට්ටමේදී තෙගුණයක් පමණ ද, ඉහළ මට්ටමේදී දස ගුණයක් පමණ ද වන බව, නිරීක්ෂණය කර ඇත. එබැවින්, ගොවියාගේ තිරසාර භාවය ආරක්ෂා කිරීමටත්, පාරිභෝගිකයාගේ ජීවන බර අඩු කිරීමටත්, කෘෂි නිෂ්පාදනයන්හි මිල ගණන් ස්ථායීකරණය කිරීම අත්‍යවශ්‍ය වේ.

මෙම ප්‍රශ්නය සඳහා සම්ප්‍රදායානුකූලව පොදුවේ භාවිතා කෙරුන විසඳුම් දෙකකි. ඒවා නම් අවම මිලක් යටතේ කෘෂි නිෂ්පාදන මිලට ගැනීමේ ක්‍රමයක් හඳුන්වාදීම සහා රජයේ අලෙවි ආයතන පිහිටුවීමය. මෙවැනි ක්‍රමයන් කෙටි කාලීනව ප්‍රතිඵලදායී වුවත් දිගු කාලීනව ඒවා අසාර්ථකවන ප්‍රයත්නයන් බව පසක් වී ඇත. මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන්ම හේතුකාරක වී ඇත්තේ දිගින් දිගටම ද්විත්ව මිල ක්‍රමයක් පවත්වාගෙන යාම අපහසු වීමත්, ඵලදායී අලෙවි ආයතන වශයෙන් ක්‍රියා කිරීමේදී රජයේ අලෙවි මණ්ඩලයන් එතරම් කාර්යශූර තත්ත්වයක් නොපෙන්වීමත්ය. මෙම කරුණු අනුව පෙනී යන්නේ කෙටි කාලයේදී මෙන්ම දිගු කාලයේදී ද ප්‍රතිඵලදායී විය හැකි ක්‍රමෝපායයක් වෙළඳපොල තුළින්ම ක්‍රියාත්මක කිරීම වඩාත් යෝග්‍ය බවකි. බොහෝ රටවල් මෙම ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් එනම්, ගැනුම්කරුට හා විකුණුම්කරුට පිළිගත හැකි මිලක් සුරැකුම් කරනු පිණිස කෘෂි නිෂ්පාදන සඳහා ඉදිරි විකුණුම් ගිවිසුම් ක්‍රමයක් හඳුන්වා දී ඇති අතර, එහි ඵල ප්‍රයෝජනද අත්කර ගෙන ඇත.

ඉදිරි විකුණුම් ගිවිසුමක් යනු ගැණුම්කරු හා විකුණුම්කරු අතර ඇතිවන නීතිමය ලියවිල්ලකි. මෙම ගිවිසුම අනුව විකුණුම්කරු ගිවිසගත් කෘෂි නිෂ්පාදන ප්‍රමාණයක්, ගිවිසගත් ප්‍රමිතියකට අනුකූලව, ගිවිසගත් අනාගත දිනයකදී හෝ කාල වකවානුවක් තුළදී, ගිවිසගත් මිලකට ගැනුම්කරුට විකිණීමට බැඳේ. එම ප්‍රමාණය මිලදී ගැනීමට ගැණුම්කරු ද ගිවිස ගනී. එබැවින්, මෙවැනි කල්තියා ඇතිකර ගන්නා වෙළඳ ගිවිසුමක් විකුණුම්කරුගේ කෘෂි නිෂ්පාදන අලෙවිය සහතික කරනු ලබන අතර ගැණුම්කරුට ස්ථාවර සැපයුමක් ද සහතික කරනු ලබයි. ශ්‍රී ලංකාවේ මෙවැනි ක්‍රමයක් "ගොවි සහනය" යන නමින් 1999 වසරේදී මහ බැංකුව විසින් ක්‍රියාවට නංවන ලදී. බොහෝ කලක සිට ශ්‍රී ලංකාව තුළ මෙවැනි ඉදිරි විකුණුම් ක්‍රියාපිළිවෙත් නොවිධිමත් අයුරින් ක්‍රියාත්මක වුවත්, විධිමත් පදනමක් මත එවැනි ඉදිරි විකුණුම් ගිවිසුම් ක්‍රියාවලියක් හඳුන්වාදෙන ප්‍රථම අවස්ථාව වශයෙන් ගොවි සහනය වැඩසටහන හැඳින්විය හැකිය. 1896 දී පනවන ලද භාණ්ඩ අලෙවි කිරීමේ ආඥා පනත යටතේ මෙම ඉදිරි විකුණුම් ගිවිසුම් නීත්‍යානුකූලභාවය ලබයි. ශ්‍රී ලංකාවේ


හඳුන්වා දුන් මෙම ක්‍රමයෙහි ගැනුම්කරුට හා විකුණුම්කරුට අමතරව ගිවිසුම සඳහා පහසුකම්කරුවෙකු වශයෙන් වාණිජ බැංකුවක් සහභාගි වෙයි. එබැවින් මෙම ක්‍රමය, ගොවියා, ගැනුම්කරු හා බැංකුව යන පාර්ශව තුනක සහභාගිත්වයෙන් සිදුවන ස්වේච්ඡා ක්‍රියාවලියකි. මේ නිසා ගිවිසුම සඳහා සහභාගි වන පාර්ශවයන් තුනම තම තමන්ගේ අභිමතයට අනුකූලව ගිවිසුම සකස් කර ගනී. මේ ආදී කරුණු නිසා ඉදිරි විකුණුම් ගිවිසුම් ක්‍රියාදමය වෙළඳපොල තුළින්ම මිල ස්ථායීකරණය කිරීමක් බවට පත් වේ.

ඉදිරි විකුණුම් ගිවිසුම, වසර මුළුල්ලේම ගොවියාගේ කෘෂි නිෂ්පාදනයන්හි මිල පිළිබඳ සහතික වීමක් සිදු කරනු ලබයි. නිෂ්පාදන පිරිවැයට ලාභ ආන්තිකයක් එකතු කිරීම තුළින් විකුණුම් මිල තීරණය කරන බැවින් ගොවියාට ශුද්ධ ලාභයක් ද ලැබේ. එමෙන්ම, ගැණුම්කරු වෙතද එකඟ වූ මිලක් යටතේ නිශ්චිත සැපයුමක් සහතික වන බැවින් සිය නිෂ්පාදන ක්‍රියාවලිය මෙන්ම මුදල් ප්‍රවාහ සැලැස්මද කල්තියා පිළියෙල කරගත හැකිය. මෙම ක්‍රියාවලියේදී බැංකුකරුවාගේ කාර්යය වන්නේ නිෂ්පාදන වර්ග, නිෂ්පාදන පිරිවැය, නිෂ්පාදන ලබාගත හැකි කාලය, සුදුසු ගැනුම්කරුවන් හා සුදුසු සැපයුම්කරුවන් යනාදිය පිළිබඳව තොරතුරු දෙපාර්ශවයටම සැපයීමයි. මෙම සේවාව වෙනුවෙන් විකුණුම්කරුගෙන් හා ගැණුම්කරුගෙන් කොමිස් මුදලක් ලබාගැනීමට ද බැංකුකරුට හැකිවේ. මෙයට අමතරව, ඉදිරි විකුණුම් ගිවිසුම් ක්‍රියාදමය තුළින් සහභාගිවන පාර්ශව දෙක වෙත සෘජු ලෙස ණය ලබාදීමක් හෝ වෙනත් චක්‍රාකාර ක්‍රමයකට පහසුකම් සැලසීමක් හෝ වශයෙන් එම ක්‍රියාවලිය මූල්‍යකරණය කිරීමේ අවස්ථාව ද බැංකුකරුට උදා වේ. පළමු ක්‍රමය යටතේ, ගොවියා හට සිය වගා කටයුතු කරගෙන යාම සඳහා ණය මුදලක් ද, ගැනුම්කරු හට එම නිෂ්පාදන මිලදී ගැනීම සඳහා ණය මුදලක් ද පහසුකම්කාරක බැංකුවට සැපයිය හැකිය. දෙවැනි ක්‍රමයේදී ගැනුම්කරු විසින් විකුනුම්කරු අමතා ලියනු ලබන දේශීය බිල්පතක් වට්ටම් කිරීමේ අවස්ථාවද බැංකුවට උදාවේ. බිල්පත වට්ටම් කළ බැංකුව විසින් එම බිල්පත නියමිත දිනයේදී අදාළ ගැනුම්කරු වෙත ගෙවීම පිණිස ඉදිරිපත් කරනු ලැබේ. තවද, ගැනුම්කරු විසින් අනාගත දිනයකදී විකුණුම්කරුගෙන් මිලදී ගැනීමට එකඟ වූ කෘෂි නිෂ්පාදන තොගයේ වටිනාකමට සමාන දේශීය ණයවර ලිපියක් විකුණුම්කරු වෙනුවෙන් විවෘත කිරීම හඳුන්වා දීමද මෙම ක්‍රියාවලියෙහි වර්ධනාත්මක පියවරක් ලෙස හැඳින්විය හැකිය.

ඉදිරි විකුණුම් ගිවිසුම් ක්‍රමය ක්‍රියාත්මක වන ආකාරය සටහනෙහි පෙන්වා දී ඇත.

ඉදිරි විකුණුම් ගිවිසුම් ක්‍රමය සඳහා ගොවියන් හා ගැනුම්කරුවන් උනන්දු කරවනු වස් 2000 වසර සඳහා වන රජයේ අය වැය යටතේ වෙළඳ ගිවිසුම්, දේශීය බිල්පත් සහ දේශීය ණයවර ලිපි මුද්දර බද්දෙන් ද නිදහස් කර ඇත.

## ඉදිරි විකුණුම් ගිවිසුම් ක්‍රමය ක්‍රියාත්මක වන ආකාරය



## 3.3 අපනයන බෝග

### තේ

1993 වසරේ සිට තේ නිෂ්පාදනයේ නොකඩවා පැවති ඉහළ යාමේ ප්‍රවණතාවය තවදුරටත් පවත්වාගෙන යමින් 1999 වනවිට තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 284 ක නව වාර්තාගත මට්ටමකට ලඟා විය. මෙය පසුගිය වසරේ පැවති ඉහළතම නිෂ්පාදනයටත් වඩා සියයට එකක වැඩි වීමකි. මුළු නිෂ්පාදනයේ මෙම වර්ධනයට මුළුමණින්ම හේතු වූයේ උස් බිම් තේ නිෂ්පාදනයේ සතුටුදායක වර්ධනයයි. පසුගිය වසර තුළදී සියයට 9 ක පසු බැස්මක් පෙන්නුම් කළ උස් බිම් තේ නිෂ්පාදනය 1999 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 81 දක්වා සියයට 7 කින් වර්ධනය විය. උඩ රට තේ වගා කරන ප්‍රදේශවල පැවති හිතකර කාලගුණික තත්ත්වය මෙන්ම දියුණු කළ කෘෂිකාර්මික කටයුතු සහ කළමනාකරණය මෙම සතුටුදායක ක්‍රියාකාරිත්වය කෙරෙහි දයක විය. පහත් බිම් තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 149 දක්වා සියයට 1 කින් පහත වැටුණි. නිෂ්පාදනයේ මෙම පහත වැටීම තිබියදීත් පහත් බිම් තේ නිෂ්පාදනය මුළු නිෂ්පාදනයෙන් සියයට 52 කට දයක විය. මැදි බිම් තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 53 දක්වා සියයට 1 කින් පහත වැටීමක් පෙන්නුම් කෙරිණි.

1998 වසර හා සැසඳීමේදී කුඩා වතු හිමියන්ගේ තේ නිෂ්පාදනය 1999 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 164 දක්වා සියයට 1 කින් පහත වැටී ඇත. පසුගිය වසර කිහිපය තුළදී තේ වතු කප්පාදු කිරීම අතහැර දමූ කුඩා වතු හිමියන් බහුතරයක්ම මෙම වසරේ මුල් භාගය තුළදී පහත් මට්ටමක පැවති තේ මිල හේතුවෙන් එම කාලය තුළදී තම තේ වතු කප්පාදු කිරීමට පෙළඹුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1999 වසර තුළදී කුඩා වතු හිමියන්ගේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 164 දක්වා සියයට 1 කින් පහත වැටුණි. අඩු මිල ගණන් පැවතීම වතු හිමියන්ගේ පොහොර යෙදීම අධෛර්යමත් කල අතර හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 2,166 දක්වා සියයට 1 කින් අඩු වූ අස්වැන්නේ සාමාන්‍යයට එමගින් අයහපත් බලපෑමක් ඇති විණි. කෙසේ වෙතත්, කප්පාදු කිරීම නිසා දිගුකාලීන වශයෙන් ඵලදායීතාවය වැඩි වීමක් පෙන්නුම් කරනු ඇත. මේ අතර, වතු අංශයේ සාමාන්‍ය ඵලදායීතාවය හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1,087 ක් විය. සාමාන්‍ය ජාතික ඵලදායිතා මට්ටම හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1,514 ක් විය.

1998 සැප්තැම්බර් සිට පහත වැටීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කල තේ මිල, රුසියාවේ රූබල් අර්බුදය හා ලෝක තේ සැපයුම ඉහළ යාම නිසා 1999 ජූනි මාසය තෙක් තවදුරටත් පහත වැටුණි. වසර මුල් භාගය තුළ පසුබෑමකට ලක් වූ තේ මිල, ගුණාත්මක බවෙන් උසස් තේ නිෂ්පාදනය වන කාලය (quality season) උදා වීමත් සමග යථා තත්ත්වයට පත් විය. මෙම මිල ඉහළ යාමේ ප්‍රවනතාවය ඉන්දියාව සහ කෙන්යාව වැනි තේ නිෂ්පාදනය කරන ප්‍රධාන රටවල නිෂ්පාදනය පහළ වැටීම සහ කොළඹ තේ වෙන්දේසියේ රුසියාවේ ක්‍රියාශීලී සහභාගිත්වය නිසා වසරේ අග භාගය දක්වා අඛණ්ඩව පැවතිණි. අහිතකර කාලගුණික තත්ත්වයන් නිසා ඉන්දියාව සහ කෙන්යාව යන රටවල තේ නිෂ්පාදනය 1999 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 100 කින් පමණ පහත වැටුණි. වසර අග භාගයේදී තේ මිලෙහි සැළකිය යුතු දියුණුවක් තිබියදීත් කොළඹ තේ වෙන්දේසියේ වාර්ෂික සාමාන්‍ය තේ මිල 1998 වර්ෂයට වඩා සියයට 14 කින් පහළ මට්ටමක පැවතිණ.

වසර මුල් භාගයේදී අපනයන මිල ගණන් අඩු වීම නිසා 1999 වසරේදී තේ අපනයනයෙන් ලත් ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 43,700 දක්වා සියයට 13 කින් පහත වැටුණි. තේ සඳහා වූ සාමාන්‍ය අපනයන මිල කිලෝ ග්‍රෑමයකට රුපියල් 185 (එක්සත් ජනපද ඩොලර් 2.88) සිට කිලෝ ග්‍රෑමයකට රුපියල් 162 (එක්සත් ජනපද ඩොලර් 2.30) දක්වා සියයට 12 කින් පහත වැටුණි. අපනයනය කරන ලද තේ ප්‍රමාණයද 1998 වර්ෂයට වඩා මඳ වශයෙන් අඩු විය. එක්සත් අරාබි එමීර් රාජ්‍යය, රුසියාව, තුර්කිය, සිරියාව සහ එක්සත් රාජධානිය යන ප්‍රධාන ගැනුම්කරුවන් පස් දෙනෙක් එක්ව ශ්‍රී ලංකාවේ මුළු තේ අපනයනයෙන් සියයට 51 ක් මිලදී ගන්නා ලදී. මෙයින් එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ රුසියාව එක් රටක් සියයට 15 බැගින් මුළු තේ අපනයනයෙන් සියයට 30 ක් මිලදී ගන්නා ලදී.

එකතු කළ වටිනාකමක් සහිත තේ නිෂ්පාදනය නගා සිටුවීම සඳහා දිරි ගැන්වීම් සලසා තිබියදීත් 1999 දී එකතු කළ වටිනාකම සහිත තේ අපනයනයේ සතුටුදායක ක්‍රියාකාරිත්වයක් දක්නට නොලැබුණි. 1998 දී තේ අපනයනයේ තේ පැකට් සහ තේ මලු අපනයන කොටස වූ සියයට 34 සහ සියයට 4.4 සිට 1999 දී පිළිවෙලින් සියයට 30 සහ සියයට 4.2 දක්වා පහත වැටුණි. 1995 දී සියයට 49 ලෙස පැවති තොග වශයෙන් අපනයනය කරන ලද තේ ප්‍රමාණය ක්‍රමයෙන් වර්ධනය වෙමින් 1998 දී සියයට 59 ක් සහ 1999 දී සියයට 64 ක් බවට පත් විය.

තේ මලු, පිළියෙල කිරීමට පහසු ශීත කල තේ (ready to serve cold tea), රස ගැන්වූ තේ වැනි එකතු කරන ලද වටිනාකමක් සහිත තේ නිෂ්පාදන සඳහා දියුණු කළහැකි දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළක් ඇත. තේවල ඇති සෞඛ්‍යාරක්ෂක සහ නිවාරණ ශක්තිය පිළිබඳව ලෝ වටා විශාල වශයෙන් කරන ලද පර්යේෂණ කටයුතු ජාත්‍යන්තර වශයෙන් තේ ප්‍රචාරක වැඩපිළිවෙලවල් සඳහා යොදගත යුතුව ඇත. ජර්මනිය, ප්‍රංශය සහ එක්සත් රාජධානිය වැනි ප්‍රධාන පෙළේ වෙළඳපොළවල් සඳහා කාබනික තේ (organic tea) නිෂ්පාදනය සමහර පෞද්ගලික සමාගම් ආරම්භ කර ඇත. කාබනික තේ සඳහා ජාත්‍යන්තර ඉල්ලුම වැඩි වෙමින් පවතින අතර එක්සත් ජනපදය, යුරෝපය සහ ජපානය වැනි රටවල සෞඛ්‍යාරක්ෂාව පිළිබඳව සැළකිලිමත් වන පාරිභෝගිකයන්ට බෙදා හැරීම සඳහා කාබනික තේ නිෂ්පාදනය නංවාලීමට ඉන්දියාව දනටමත් සැළසුම් කර ඇත.

විදේශීය තේ සමග දේශීය තේ මිශ්‍ර කිරීම සඳහා 1999 වසරේදී තේ ආනයනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 1.9 ක්


### 3.2 සංඛ්‍යා සටහන
### තේ වගා අංශය පිළිබඳ සංඛ්‍යා

| අයිතමය | ඒකකය | 1997 | 1998(අ) | 1999(ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය | කි.ග්‍රෑ.දශලක්ෂ | 277 | 280 | 284 |
| උස් බිම් | කි.ග්‍රෑ.දශලක්ෂ | 84 | 76 | 81 |
| මැදි බිම් | කි.ග්‍රෑ.දශලක්ෂ | 57 | 54 | 54 |
| පහත් බිම් | කි.ග්‍රෑ.දශලක්ෂ | 136 | 150 | 149 |
| 2. බිම් ප්‍රමාණය (ඇ) | | | | |
| මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 194 | 195 | 195 |
| දළු කැඩීම යටතේ ඇති | හෙක්ටයාර දහස් | 177 | 180 | 187 |
| 3. පොහොර භාවිතය | මෙට්‍රික් ටොන් දහස් | 160 | 182 | 166 |
| 4. නැවත වගා කිරීම | හෙක්ටයාර | 926 | 1,234 | 1,358 |
| 5. අළුතින් වගා කිරීම | හෙක්ටයාර | 340 | 400 | 424 |
| 6. මිල | | | | |
| කොළඹ | කි.ග්‍රෑ./රුපියල් | 119.40 | 134.35 | 115.31 |
| අපනයන(නැ.වි.ස.) | කි.ග්‍රෑ./රුපියල් | 158.39 | 184.94 | 162.39 |
| 7. නිෂ්පාදන පිරිවැය (ඈ) | කි.ග්‍රෑ./රුපියල් | 90.26 | 100.71 | 95.36 |
| 8. අපනයන | කි.ග්‍රෑ.දශලක්ෂ | 269 | 272 | 268 |
| 9. අපනයන ඉපැයුම් | රුපියල් දශලක්ෂ | 42,533 | 50,280 | 43,728 |
| | එ.ජ.ඩොලර් දශලක්ෂ | 719 | 780 | 621 |
| 10.එකතු කළ අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 2.4 | 2.8 | 2.4 |

මූලයන් : ශ්‍රී ලංකා තේ මණ්ඩලය
ජාතික පොහොර ලේකම් කාර්යාලය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) තේ කොමසාරිස් අංශය මගින් කරන ලද සමීක්ෂණයක දත්ත මත පදනම් වේ. (අත් හරින ලද තේ ඉඩම් ඇතුලත් නොවේ.)
(ඈ) අමු තේ දළු සැපයුම් කරුගේ ලාභාංශද ඇතුලත් වේ.
(ඉ) වගා කිරීම සහ සැකසුම් කටයුතුවල පමණි.

3.1 රූප සටහන
මිල සහ නිෂ්පාදන පිරිවැය පිළිබඳ දර්ශක : තේ
(1990 = 100)




වූ අතර එය 1998 ආනයනය හා සසඳනවිට සියයට 56 ක අඩු වීමකි. මුළු ආනයනයන් දේශීය තේ නිෂ්පාදනයෙන් සියයට 1 කටත් වඩා අඩුය.

වසර මුල් භාගයේදී තේ මිල අඩු වීම නිසා බොහෝ තේ කම්හල් හිමියන්ට මූල්‍යමය අර්බුදයන්ට මුහුණපෑමට සිදු විය. එයට සහනයක් වශයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් මාස දෙකක කාරක ප්‍රාග්ධනයක් මත කම්හල් හිමියන් සඳහා කෙටිකාලීන ණය ක්‍රමයක් යෝජනා කරන ලදී. රුපියල් දශ ලක්ෂ 7 දක්වා වූ මෙම ණය මුදල් වාණිජ බැංකු මගින් බෙදා හරින ලද අතර ඒවා සහනදායී පොලී ක්‍රමයක් යටතේ මාස 3 ක සහන කාලසීමාවක් සමග අවුරුදු දෙකකින් ආපසු ගෙවිය යුතු විය. තේ කම්හල්වල නිෂ්පාදන ධාරිතාව තීරණය කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වාණිජ බැංකුවලට සහාය දෙනු ලැබූ අතර මුදල් අමාත්‍යාංශය ඒ සඳහා ඇප ලබා දෙන ලදී. 1999 දෙසැම්බර් අවසානය වනවිට ඉහත ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 162 ක් ප්‍රදානය කර ඇත.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය (TSHDA) තේ නැවත වගා කිරීමට සහ අළුතෙන් වගා කිරීමට සහනාධාර යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරමින් සහ උපදේශක ව්‍යාප්ති සේවා සපයමින් තේ කර්මාන්තයේ උන්නතිය සඳහා තවදුරටත් සහාය දුණි. ඊට අමතරව 1999 අවසානය වනවිට සාමාජිකයින් 130,460 කින් සමන්විත කුඩා තේ වතු හිමියන්ගේ සංවර්ධන සමිති 1,153 ක වැඩසටහන් පැවැත්වීමද නොකඩවා සිදු කරන ලදී. 1999 වර්ෂය තුළදීද කුඩා තේ වතු හිමියන්ගේ රක්ෂණ, ඉතිරි කිරීම්, ආයෝජන සහ විශ්‍රාමික ප්‍රතිලාභයන් ආවරණය කිරීම සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් " තේ ශක්ති " යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී. 1999 අවසානයේදී මෙහි මුළු සාමාජික සංඛ්‍යාව 100,924 ක් වූ අතර මෙම යෝජනා ක්‍රමය යටතේ කරන ලද මුළු ඉතිරි කිරීම් හා ආයෝජනයන් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 86 ක් සහ රුපියල් දශ ලක්ෂ 80 ක් විය. 1999 අවසානය වනවිට තේ ශක්ති විශ්‍රාම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභීන් 438 දෙනෙකුට රුපියල් දශ ලක්ෂ 14 ක් රක්ෂණ ප්‍රතිලාභ වශයෙන් ගෙවා ඇත. තේ ශක්ති ආයෝජන ව්‍යාපෘතිය සඳහා 1998 අයවැය ප්‍රතිපාදනයන් වූ රුපියල් දශ ලක්ෂ 200 මුළුමණින්ම යොදා ගන්නා ලදදේ ප්‍රවාහන ජාලය නංවාලීමටත්, වර්ණ විභේදක මිලදී ගැනීමට සහ තේ කම්හල් පිහිටුවීමටත්ය. කුඩා වැවිලි කරුවන්ගේ සුභසිද්ධිය සඳහා තෝරා ගත් ස්ථානවල කම්හල් 21 ක් පිහිටුවීමේ ඉලක්කයක් විය. " සංවර්ධන අරමුදල" වැඩසටහන යටතේ කුඩා තේ කම්හල් හිමියන්ට අවශ්‍ය යෙදවුම් මිලදී ගැනීම සඳහා ණය පහසුකම් සලසන ලදී. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන ලද සහනාධාර යෝජනා ක්‍රමය යටතේ, ප්‍රතිපත්තියක් වශයෙන්, එක් බලපත් හිමියකුට තේ නැවත වගා සඳහා සහනාධාර ලබා ගැනීමට හිමිකම් ඇති උපරිම ඉඩම් ප්‍රමාණය අක්කර 1 ට සීමා කරන ලදී. මීට අමතරව, වර්ෂ 2000 වනවිට සාමාන්‍ය ඵලදායිතාවය හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 2,300 දක්වා වැඩි කිරීමේ අරමුණෙන් ඵලදායිතා වර්ධන සැලසුමක් ක්‍රියාත්මක කරන ලදී.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් තේ සංවර්ධන සමිති හරහා පොහොර ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම නොකඩවා සිදු කරන ලදී. 1999 දී මෙම යෝජනා ක්‍රමයේ පරිපාලනය තේ කොමසාරිස්ගේ අංශය වෙතින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට පවරා දෙන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ 1999 දී සපයන ලද පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 11,936 ක් විය.

## රබර්

1996 වසරේ සිට පහත වැටීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කළ රබර් නිෂ්පාදනය 1999 වසරේදී සියයට 1 කින් කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 97 දක්වා වර්ධනය විය. රබර් වගා කරන ප්‍රදේශවල වගාවට හිතකර වියළි කාලගුණයක් ව්‍යාප්තව තිබීමත්, ඒ නිසාම කිරි කැපීමේ දින ගණනෙහි වූ වර්ධනයත් නිෂ්පාදනය වැඩි වීම කෙරේ බලපෑවේය. 1998 වසරේදී සෙස් බද්ද ඉවත් කිරීම සහ මුදලේ අගය අවප්‍රමාණය වීම, ශීඝ්‍ර ලෙස පහත වැටුණ මිල ගණන්වලට සාර්ථකව මුහුණ දීමට සුළු රබර් ඉඩම් හිමියන්ට උපකාරී විය.


පසුගිය වසර හා සැසඳීමේදී ආර්.එස්.එස්.1 හා ලේටෙක්ස් ක්‍රේප් IX යන වර්ගවල වාර්ෂික සාමාන්‍ය මිල පිළිවෙලින් සියයට 10 කින් සහ සියයට 18 කින් පහත වැටුණි. කෙසේ වෙතත් ජාත්‍යන්තර වෙළඳපොළේ ප්‍රවණතාවය පිළිබිඹු කරමින් වසරේ අවසාන කාර්තුවේදී කොළඹ වෙන්දේසියේ රබර් මිල ගණන්වල වර්ධනයක් දක්නට ලැබුණි. පසුගිය වසරේ ආර්.එස්.එස්. 1 වර්ගයේ රබර් කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය මිල වූ රු. 45 සමග සසඳ බලන කළ 1999 වසරේ අවසන් කාර්තුවේදී ආර්.එස්.එස්.1 වර්ගයේ රබර් කිලෝ ග්‍රෑමයක මිල රු. 52 ක් විය. ලේටෙක්ස් ක්‍රේප් IX වර්ගයේ රබර්වල මිලෙහිද එයට සමාන නැඹුරුවක් පෙන්නුම් කළේය. 1999 අවසන් කාර්තුවේ මිල කිලෝ ග්‍රෑමයකට රු. 61 ක් වූ ලේටෙක්ස් ක්‍රේප් IX රබර්වල වාර්ෂික සාමාන්‍ය මිල කිලෝ ග්‍රෑමයකට රු. 52 ක් විය. ලේටෙක්ස් ක්‍රේප් හා ආර්.එස්.එස්. වර්ගවලට ලැබුණු සාපේක්ෂව අඩු මිල ගණන් හේතුවෙන්, රබර් නිෂ්පාදනය, කේන්ද්‍රාපසාරී කිරි නිෂ්පාදනය කෙරෙහි යොමු වීමෙන් කේන්ද්‍රාපසාරී කිරි නිෂ්පාදනය 1998 වසරේ පැවති සියයට 5 සිට සියයට 18 ක් දක්වා වර්ධනයක් 1999 වසරේදී පෙන්නුම් කරන ලදී.

1999 වසරේදී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ස්වභාවික රබර් ගිවිසුමෙන් (INRA) ඉවත් වීමට තීරණය කරන ලදී. මැලේසියාව සහ තායිලන්තයද එම ගිවිසුමෙන් ඉවත් වී ඇත. මෙසේ ඉවත් වීමට හේතු වූයේ ජාත්‍යන්තර ස්වභාවික රබර් සංවිධානයට (INRO) ජාත්‍යන්තර වෙළඳපොළේ මිල

3.2 රූප සටහන

**මිල සහ නිෂ්පාදන පිරිවැය පිළිබඳ දර්ශක - රබර්**

(1990 = 100)




ස්ථායීකරණය කිරීමට නොහැකිවීම නිසාය. එලෙස ඉවත් වීම හේතුවෙන් " ජාත්‍යන්තර ස්වභාවික රබර් ගිවිසුම" 1999 වසරේදී අත්හිටුවන ලදී.

**3.3 සංඛ්‍යා සටහන**

**රබර් වගා අංශය පිළිබඳ සංඛ්‍යා**

| අයිතමය | ඒකකය | 1997 | 1998(අ) | 1999(ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය | කි.ග්‍රෑ.දශලක්ෂ | 106 | 96 | 97 |
| 2. බිම් ප්‍රමාණය (ඇ) | | | | |
| වගාව යටතේ ඇති | හෙක්ටයාර් දහස් | 163 | 158 | 159 |
| කිරි කැපීම යටතේ ඇති | හෙක්ටයාර් දහස් | 129 | 125 | 128 |
| 3. ඵලදාව | හෙක්ටයාරයකට කි.ග්‍රෑ. | 822 | 768 | 755 |
| 4. පොහොර භාවිතය | මෙට්‍රික් ටොන් දහස් | 12 | 15 | 11 |
| 5. නැවත වගා කිරීම්(ඇ) | හෙක්ටයාර | 1,172 | 1,160 | 643 |
| 6. අළුතින් වගා කිරීම (ඇ) | හෙක්ටයාර | 793 | 515 | 218 |
| 7. මිල | | | | |
| අපනයන(නැ.වි.ස.) | කි.ග්‍රෑ./රුපියල් | 75.96 | 67.72 | 53.90 |
| කොළඹ(ආර්.ඇස්.ඇස්.1) | කි.ග්‍රෑ./රුපියල් | 56.62 | 49.76 | 45.33 |
| 8. නිෂ්පාදන පිරිවැය | කි.ග්‍රෑ./රුපියල් | 40.37 | 42.00 | 43.50 |
| 9. අපනයන | කි.ග්‍රෑ.දශලක්ෂ | 62 | 41 | 43 |
| 10. දේශීය පරිභෝජනය | කි.ග්‍රෑ.දශලක්ෂ | 44 | 54 | 54 |
| 11. අපනයන ඉපැයුම් | රුපියල් දශලක්ෂ | 4,640 | 2,808 | 2,305 |
| | එ.ජ.ඩොලර් දශලක්ෂ | 79 | 44 | 33 |
| 12. එකතු කළ අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 0.7 | 0.5 | 0.4 |

මූලයන් : රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
ජාතික පොහොර ලේකම් කාර්යාලය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) 1993 ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ කෘෂිකාර්මික බෝග සහ පශු සම්පත් සමීක්ෂණය 1993 මත පදනම් වේ.
(ඇ) වගා කළ බිම් ප්‍රමාණය රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගා සහන යෝජනා ක්‍රමය අනුවය.
(ඉ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.

ඇමෙරිකා එක්සත් ජනපදය, දකුණු කොරියාව සහ චීනය වැනි රට වලින් සිදු විය හැකි වැඩි ඉල්ලුම හේතුවෙන් ස්වභාවික රබර් මිලෙහි වැඩි වීමක් අපේක්ෂා කරනු ලැබේ. තවද, ඛනිජ තෙල් මිල ඉහළ යාම හේතුවෙන් කෘත්‍රිම රබර් මිල ගණන් ඉහළ යාම නිසාද ස්වභාවික රබර් සඳහා වන ඉල්ලුම වැඩි වනු ඇත.

1996 වසරේ සිට පැවති රබර් නැවත වගා කිරීම අඩු වීමේ ප්‍රවනතාවය රබර් සඳහා වූ අඩු මිළ ගණන් හේතුවෙන් 1999 වසර තුළද දක්නට ලැබිණි. සමහර කුඩා රබර් ඉඩම් හිමියන් නැවත වගාව සඳහා සකස් කළ ඉඩම්වල වෙනත් බෝග වගා කිරීමද රබර් නැවත වගා කිරීමේ කාර්යයට අහිතකර ලෙස බලපෑවේය. එසේම මෙම වසර තුළදී අළුතින් රබර් වගා කිරීමේ බිම් ප්‍රමාණය හෙක්ටයාර 218 දක්වා සියයට 58 කින් පහත වැටිණි.

හෙක්ටයාර එකකට කිලෝ ග්‍රෑම් 900 ක් වූ ශ්‍රී ලංකාවේ ජාතික සාමාන්‍ය රබර් ඵලදාව රබර් පර්යේෂණ ආයතනය විසින් ඇස්තමේන්තු කරන ලද හෙක්ටයාර එකකට කිලෝ

ග්‍රෑම් 1,500 - 2,000 දක්වා වූ විභවතාවයක් ඇති ඵලද මට්ටමට වඩා විශාල ලෙස අඩු මට්ටමක පැවතුණි. රබර් වගාකරුවන්ගෙන් බහුතරය වැහි ආවරණ භාවිතා නොකිරීමත්, නිර්දේශිත පොහොර ප්‍රමාණ භාවිතා නොකිරීමත් ඵලද මට්ටමේ පහත වැටීමට හේතු විය.

රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත සඳහා රබර් ඉතා අගනා අමු ද්‍රව්‍යයකි. පසුගිය වසර කිහිපය තුළ පෙන්නුම් කළ කර්මාන්ත අංශයේ දේශීය රබර් පරිභෝජනය නොකඩවා ඉහළ යාමේ ප්‍රවනතාවය 1999 වසර තුළද එලෙසම පවත්වාගෙන යන ලදී. දේශීය රබර් පරිභෝජනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 54 දක්වා සුළු වශයෙන් වර්ධනය වූ අතර එය මුළු දේශීය රබර් නිෂ්පාදනයෙන් සියයට 56 ක් විය. දැනට ලෝකයේ විශාලතම (Industrial tyre) ඝන රබර් ටයර් නිෂ්පාදකයා ශ්‍රී ලංකාවයි. කෙසේ වෙතත් ඝන රබර් ටයර්වලට වඩා වැඩි එකතු කල වටිනාකමක් උසස් තත්ත්වයේ හුලං පුරවන ලද ටයර්වලට (pnematic) ලබා ගත හැකි නිසා එම ටයර් නිෂ්පාදනයට මාරු වීම නිර්දේශ කෙරේ. බොහෝ රටවල රසායනිකව පදම් කළ රබර් ලී උසස් තත්ත්වයේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොද ගනු ලැබේ. ශ්‍රී ලංකාවේද රසායනිකව පදම් කළ රබර් ලී ආශ්‍රිත ගෘහ භාණ්ඩ නිෂ්පාදනය පුළුල් කිරීම සඳහා ඉතා ඉහළ හැකියාවක් ඇත.

## පොල්

1999 පොල් නිෂ්පාදනය ගෙඩි දශ ලක්ෂ 2,808 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය පසුගිය වසරෙහි නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 10 ක සැළකිය යුතු වර්ධනයකි. මෙය 1986 න් පසු වාර්තා වූ ඉහළම නිෂ්පාදනයයි. පොහොර භාවිතය ඉහළ යාමත්, 1998 වසර පුරා අඛණ්ඩව බලපැවැත්වූ හිතකර කාලගුණික තත්ත්වයේ පසුකාලීන බලපෑම හා පොල් වගා කරන ප්‍රදේශවලට 1999 වසර පුරා ව්‍යාප්තව ලැබුණු වර්ෂාපතනයත් පොල් නිෂ්පාදනය ඉහළ යෑමට බලපෑ ප්‍රධාන සාධකයන් විය. පොල් ගෙඩි නිෂ්පාදනය ඉහළ යාමේ හේතුවෙන් පොල් මද ආශ්‍රිත නිෂ්පාදනවලද (පොල් තෙල් හැර) ඉහළ නැගීමක් වාර්තා විය. වඩාත් සැළකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කළ කපාපු පොල් නිෂ්පාදනය පසුගිය වසරෙහි නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 50 ක පමණ ප්‍රගතියක් අත් කර ගන්නා ලදී. පසුගිය වසරට සාපේක්ෂව පොල් කිරම සහ පිටි කල පොල් කිරි නිෂ්පාදනයද සියයට 35 ක වර්ධනයක් පෙන්නුම් කළේය. කොප්පරා අපනයනය සහ ගෙඩි පොල් අපනයනය පිළිවෙලින් සියයට 41 කින් සහ සියයට 20 කින් වැඩි විය.

ජාත්‍යන්තර සැපයුමෙහි වූ විශාල ඌනතාවය හේතුකොටගෙන වසර පුරාම වෙළඳපොළෙහි කපාපු පොල් සඳහා ආකර්ශණීය මිල ගණන් පැවතුණි. පසුගිය දෙවසර තුළ ඉන්දුනීසියාව සහ පිලිපීනය යන රටවලට බලපැවැත්වූ "එල්නිනෝ" සහ "ලානිනා" දේශගුණික තත්ත්වයන් හේතුකොටගෙන එම රටවල කපාපු පොල් අපනයනය පහත වැටුණු බැවින් කොළඹ වෙන්දේසිවල කපාපු පොල් සඳහා ලද මිල ගණන් පසුගිය වසරට සාපේක්ෂව සියයට 23 කින් ඉහළ ගියේය. යහපත් මිල ගණන් හේතුවෙන් කපාපු පොල් නිෂ්පාදනය ඉහළ ගියද පොල් තෙල් නිෂ්පාදනය අඩාල විය.

වසරෙහි ප්‍රථම භාගය තුළ පොල් තෙල් සඳහා ආකර්ශණීය මිල ගණන් පැවතියද පාම් තෙල් වැනි ලාභදායී

**3.4 සංඛ්‍යා සටහන**
**පොල් වගා අංශය පිළිබඳ සංඛ්‍යා**

| අයිතමය | ඒකකය | 1997 | 1998(අ) | 1999(ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය (ඇ) | ගෙඩි දශලක්ෂ | 2,631 | 2,552 | 2,808 |
| කපාපු පොල් | ගෙඩි දශ ලක්ෂ(ඇ) | 524 | 361 | 541 |
| පොල්තෙල් | ගෙඩි දශ ලක්ෂ(ඇ) | 289 | 334 | 309 |
| කොප්පරා(ඉ) | ගෙඩි දශ ලක්ෂ(ඇ) | 42 | 44 | 62 |
| පොල්ගෙඩි අපනයනය | ගෙඩි දශලක්ෂ | 18 | 17 | 21 |
| දේශීය පොල් ගෙඩි පරිභෝජනය (ඊ) | ගෙඩි දශලක්ෂ | 1,744 | 1,779 | 1,799 |
| 2. මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 417 | 439 | 439 |
| 3. නැවත වගාව/යටි වගාව(උ) | හෙක්ටයාර | 1,221 | 595 | 698 |
| 4. නව වගාව(උ) | හෙක්ටයාර | 931 | 656 | 660 |
| 5. පොහොර භාවිතය | මෙට්‍රික් ටොන් දහස් | 35 | 38 | 42 |
| 6. නිෂ්පාදන පිරිවැය | ගෙඩිය/රුපියල් | 2.26 | 2.40 | 2.68 |
| 7. පොල් ගෙඩියක සිල්ලර මිල | ගෙඩිය/රුපියල් | 10.55 | 11.17 | 11.75 |
| 8. සාමාන්‍ය අපනයන මිල නැ.වි.ස. (ඌ) | ගෙඩිය/රුපියල් | 9.63 | 8.31 | 9.95 |
| 9. අපනයන ඉපැයුම් | රුපියල් දශලක්ෂ | 6,939 | 6,110 | 9,119 |
| | එ.ජ.ඩොලර් දශලක්ෂ | 118 | 94 | 129 |
| මද ආශ්‍රිත නිෂ්පාදන(ඌ) | රුපියල් දශලක්ෂ | 4,864 | 3,632 | 5,973 |
| | එ.ජ.ඩොලර් දශලක්ෂ | 82 | 56 | 84 |
| අනෙකුත් නිෂ්පාදන | රුපියල් දශලක්ෂ | 2,075 | 2,478 | 3,146 |
| | එ.ජ.ඩොලර් දශලක්ෂ | 35 | 38 | 45 |
| 10. එකතු කළ වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්(එ) | | 2.4 | 2.6 | 2.9 |

මූලයන් : පොල් වගා කිරීමේ මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය
ජාතික පොහොර ලේකම් කාර්යාලය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ගණනය කරන ලද්දකි. (කොප්පරා තොග වෙනස්වීම සඳහා ගැලපීම් කරන ලද බැවින් ශීර්ෂවල එකතුව මුළු නිෂ්පාදනය හා නොසැසඳේ.)
(ඇ) 1998/99 සඳහා ගෙඩි ප්‍රමාණය ගණන් බැලීමේදී යොදගත් අනුපාතිකයන්
කපාපු පොල් මෙට්‍රික් ටොන්1 - ගෙඩි 8,000
පොල්තෙල් මෙට්‍රික් ටොන්1 - ගෙඩි 8,800 සහ
කොප්පරා මෙට්‍රික් ටොන්1 - ගෙඩි 5,775
සටහන: පොල් සංවර්ධන අධිකාරිය 1996/97 දී කළ අධ්‍යයනයන් පදනම් කරගෙන 1998 අනුපාතිකයන් සංශෝධනය කරන ලදී. 1997 අනුපාතිකයන් 1997 වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.
(ඉ) අපනයන පමණි.
(ඊ) ඒකපුද්ගල වාර්ෂික ගෘහ පරිභෝජනය පොල් ගෙඩි 94.8 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. කර්මාන්ත අංශයේ ප්‍රයෝජනයට ගැනෙන පොල් ගෙඩි ප්‍රමාණය මෙයට ඇතුලත් නොවේ.
(උ) පොල් වගා කිරීමේ මණ්ඩලය මගින් දෙනු ලබන වගා සහනාධාර ක්‍රමය යටතට අයත් ඉඩම්
(ඌ) ප්‍රධාන පොල් මද නිෂ්පාදන තුන සඳහා පමණි.
(එ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.


ආදේශක වෙළඳපොළට පැමිණීමත්, වසරේ අවසන් භාගයේ පිලපීනයේ පොල් තෙල් නිෂ්පාදනය යථා තත්ත්වයට පත් වීමත් නිසා වසරේ දෙවන භාගයේ සිට පොල් තෙල් මිල පහත වැටීම ඇරඹුනි. වසර ආරම්භයේදී ආකර්ශණීය මට්ටමක තිබූ කොප්පරා මිල ගණන් වසරේ දෙවන සහ තුන් වන කාර්තුවල අවසන් අදියරයන් තුළ තාවකාලික පසුබෑමකට ලක් විය. ප්‍රධාන කොප්පරා ගැනුම්කරු වන පාකිස්ථානය තුළ මෙම කාලය තුළ බලපැවැත්වූ අස්ථාවර දේශපාලනික වාතාවරණය මෙයට හේතු විය. කෙසේ වුවද, පසුගිය වසරෙහි පැවති මිල ගණන්වලට සාපේක්ෂව කොප්පරා සඳහා වූ වාර්ෂික සාමාන්‍ය මිල සියයට 15 ක වැඩි වීමක් පෙන්නුම් කෙරිණි.

කපාපු පොල් සහ කොප්පරා අපනයනය ඉහළ යාම හේතුකොටගෙන පොල් මද ආශ්‍රිත නිෂ්පාදන වර්ග 3 හි සාමාන්‍ය අපනයන මිල ගෙඩියක් සඳහා රු. 9.95 දක්වා සියයට 20 කින් ඉහළ ගියේය. පොල් මද නිෂ්පාදන මත වූ අපනයන ඉපයීම් ප්‍රමාණය රුපියල් වටිනාකම මත ගණනය කළවිට සියයට 64 කින්ද, එ.ජ. ඩොලර් වටිනාකම මත ගණනය කළවිට සියයට 52 කින්ද සැළකිය යුතු ලෙස වැඩි විය. පොල් මද නොවන නිෂ්පාදන මත වූ අපනයන ඉපයීම් වටිනාකම රුපියල් දශලක්ෂ 3,146 ක් වූ අතර පසුගිය වසරට සාපේක්ෂව එය සියයට 27 ක් වූ සැළකිය යුතු වැඩි වීමකි. 1998 ජූනි මාසයේ සිට ක්‍රියාත්මක කරනු ලැබූ පොල් සංවර්ධන ණය යෝජනා ක්‍රමය (කප්රුක ආයෝජන) මගින් සෙස් බදු ආදයම මත පදනම් වූ සම්ප්‍රදයික සහනාධාර යෝජනා ක්‍රමයට වඩා සැළකිය යුතු වෙනසක් අපේක්ෂා කරනු ලැබීය. මෙම යෝජනා ක්‍රමය මගින් පොල් වගාව, අතුරු වගාව, පුණරුත්ථාපනය, වාරිමාර්ග, ගොවිපල යාන්ත්‍රීකරණය සහ තවාන් ආදිය සඳහා ණය ක්‍රම 11 ක් හඳුන්වා දෙන ලදී. වසර 5 කට වැඩි කාලයක් තුළ රුපියල් දශ ලක්ෂ 1,300 ක් වූ අපේක්ෂිත ආයෝජනයන් හරහා පොල් ඉඩම් අක්කර 25,000 ක් සංවර්ධනය කිරිම පිණිස කප්රුක ආයෝජන යෝජනා ක්‍රමය දයක වනු ඇත. වසර තුළ පොල් වගාකරුවන්ගෙන් මූලික ණය අයදුම්පත් 1,600 කට වඩා ලැබුණු අතර ඉන් 724 ක් සහභාගිත්ව ණය ආයතන වෙත යොමු කෙරිණි. වර්ෂය තුළ දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 50 ක් පමණ වූ ණය මුදල් ප්‍රමාණයක් අයදුම්කරුවන් 461 ක් දෙනෙකු වෙත නිකුත් කරන ලදී. පසුගිය වසරට සාපේක්ෂව පොල් ඉඩම් නැවත වගා කිරීම හෙක්ටයාර 698 ක් දක්වා සියයට 17 කින් වැඩි වූ අතර අළුතින් වගා කළ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 660 දක්වා සුළු වශයෙන් වැඩි විය. පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් ගෙවතු වගාව සඳහා පොල් පැල 780,000 කට වැඩි ප්‍රමාණයක් වර්ෂය තුළ බෙද හැර ඇත. පටක රෝපන පර්යේෂණ වැඩසටහන යටතේ මව් ශාඛයේ පටක වලින් පොල් පැල කිහිපයක් සංවර්ධනය කිරීම මගින් පොල් පර්යේෂණ ආයතනය විශාල අභියෝගයක් ජයගෙන ඇත. ආනගතයේදී මෙම තාක්ෂණය වැවිලි බෝග වගාව තුළ ඉහළ අස්වනු බීජ ව්‍යාප්ත කිරීම සඳහා යොද ගත හැකි වනු ඇත. පොල් පර්යේෂණ ආයතනයේ අධ්‍යයනයකට අනුව අක්කර 20 ට අඩු පොල් වතුවල විභව ඵලදයිතාවය හා සත්‍ය ඵලදයීතාවය අතර අස්වනු පරතරය වසර ගණනාවක් පුරා පුළුල් වෙමින් පවතින බව අනාවරණය වී ඇත. නිර්දේශිත වගා නඩත්තු ක්‍රම භාවිතා නොකිරීම හෝ වැරදි ලෙස භාවිතා කිරීම නිසා මෙම අස්වනු පරතරය ක්‍රමයෙන් වැඩි වී ඇති බව හඳුනා ගනු ලැබ ඇත. මෙම තත්ත්වය සැළකිල්ලට ගෙන අස්වනු පරතරය අඩු කිරීම හා ඵලදයීතාවය ඉහළ නැංවීම ඉලක්ක කොට, පොල් වගාවේ නිර්දේශිත නඩත්තු ක්‍රම ඇතුළු පොල් වගාවේ සියළුම අංශ සම්බන්ධයෙන් ගොවිපල කළමණාකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීමට පොල් පර්යේෂණ ආයතනය බලාපොරොත්තු වේ.

**3.3 රූප සටහන**

**මිල සහ නිෂ්පාදන පිරිවැය පිළිබඳ දර්ශක - පොල්**

(1990 = 100)




## අනෙකුත් අපනයන බෝග

රබර් සහ පොල්වලට වඩා වැඩි අපනයන ආදයමක් වාර්තා කරමින් අනෙකුත් කෘෂිකාර්මික අපනයන අංශය 1990 සිට වැදගත් අංශයක් බවට පත් විය. 1999 දී අනෙකුත් අපනයන බෝග වලින් ලත් ආදයම රුපියල් දශ ලක්ෂ 11,598 දක්වා සියයට 5 කින් වර්ධනය විය. සම්ප්‍රදයිකව අනෙකුත් අපනයන බෝග සමන්විත වන්නේ කුරුඳු, කරාබුනැටි, සාදික්කා, වසාවාසි, ගම්මිරිස්, කරදමුංගු වැනි කුළුබඩු වර්ගද, කෝපි, කොකෝවා, තල, කජු මද, පුවක්, බුලත් සහ වාෂ්පශීලී තෙල් වර්ග වැනි කෘෂි නිෂ්පාදන වලිනි. මෙම අංශයේ විශාලම කොටස හිමි කර ගන්නා තනි කෘෂි නිෂ්පාදනය වන්නේ කුරුඳුය. සකස් නොකරන ලද දුම්කොළ සහ ගම්මිරිස් අනෙකුත් වැදගත් නිෂ්පාදන වර්ග වන අතර මෙම වර්ග තුන එක්ව 1999 අපනයන බෝග අංශයේ මුළු ඉපැයීම් වලින් සියයට 65 කට දයක විය.

අපනයන කෘෂිකාර්මික බෝග අතර කුරුඳු තනි බෝගයක් ලෙස විශාල වශයෙන් පැතිර පවතී. ශ්‍රී ලංකාව, ලෝකයේ විශාලතම කුරුඳු නිෂ්පාදකයා වන අතර ලෝක නිෂ්පාදනයෙන් තුනෙන් දෙකක් පමණ සපයනු ලබයි. මෙරට නිෂ්පාදනයෙන් සියයට 90 ක් පමණ අපනයනය කරන

අතර මැක්සිකෝව කුරුඳු සඳහා ප්‍රධානතම වෙළඳපොළ වේ. අනෙකුත් වැදගත් වෙළඳපොළවල් වනුයේ ඇමෙරිකා එක්සත් ජනපදය සහ ස්පාඤ්ඤයයි. ඇමෙරිකා එක්සත් ජනපදය, ප්‍රංශය, එක්සත් රාජධානිය සහ ඉන්දියාවට ශ්‍රී ලංකාව කුරුඳු තෙල් අපනයනය කරනු ලබයි. කුරුඳු පොතු සහ කැබලිවල අපනයන ඉපයීම් පෙර වසර හා සංසන්දනාත්මකව රුපියල් දශලක්ෂ 3,530 දක්වා සියයට 9 කින් වැඩි විය. ඒ සමගම කුරුඳු තෙල් අපනයනයෙන් ලද ඉපයීම් රුපියල් දශ ලක්ෂ 168 ක් ලෙස ගණනය කෙරේ. 1999 දී කුරුඳු පොතු ගොවිපල මිල අඩු වූ අතර කුරුඳු තෙල් මිල 1998 වඩා ඉහළ මට්ටමක විය.

ජාත්‍යන්තර වෙළඳපොළේ දිස් වන ඉහළ මිල ගණන් නිසා පසුගිය වසරවල ගම්මිරිස් වගාව සීඝ්‍රයෙන් වැඩි විය. කෙසේ වෙතත්, මල් හට ගන්නා කාලය තුළ පැවති වර්ෂාපතනය නිසා 1999 දී ගම්මිරිස් නිෂ්පාදනය පහත වැටුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අපනයනය කළ ප්‍රමාණය පහත වැටුණි. සාමාන්‍ය ගොවිපල මිල (farmgate price) කිලෝ ග්‍රෑමයකට රු. 300 දක්වා සියයට 10 කින් වැඩි වී තිබියදීත් ගම්මිරිස්වල අපනයන ඉපයීම් සියයට 24 කින් පහත වැටුණි. ශ්‍රී ලංකාව විසින් ගම්මිරිස් මෙන්ම ගම්මිරිස් තෙල් කුඩා ප්‍රමාණයක්ද ප්‍රධාන වශයෙන් ඉන්දියාව, කැනඩාව සහ ඇමෙරිකා එක්සත් ජනපදයට අපනයනය කරනු ලබයි.

**3.5 සංඛ්‍යා සටහන**
**අනෙකුත් අපනයන බෝග නිෂ්පාදනයන්**

මෙට්‍රික් ටොන්

| | 1997 | 1998(අ) | 1999(ආ) |
|---|---|---|---|
| කෝපි | 2,165 | 2,343 | 2,422 |
| කොකෝවා | 1,709 | 1,904 | 1,538 |
| කුරුඳු පොතු | 11,453 | 10,813 | 11,503 |
| කුරුඳු තෙල් (කොළ) | 100 | 150 | 139 |
| ගම්මිරිස් | 2,912 | 6,776 | 4,557 |
| කරාබු නැටි | 2,333 | 1,744 | 1,902 |
| කරදමුංගු | 75 | 60 | 70 |
| සාදික්කා සහ වසාවාසි | 1,108 | 1,257 | 1,335 |
| පැඟිරි | 210 | 102 | 108 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවලට අනුව 1999 දී කරදමුංගු, කරාබුනැටි, කෝපි, සාදික්කා සහ වසාවාසි නිෂ්පාදනයන් වැඩි විය. කරාබුනැටි, කරදමුංගු, සාදික්කා සහ වසාවාසි ගොවිපල මිල සැළකිය යුතු අන්දමින් වැඩි විය. ඉන්දුනීසියාවේ කරාබුනැටි නිෂ්පාදනය පහත වැටීම නිසා ලෝක සැපයුමෙහි හිඟයක් පැවතීම මිල සැළකිය යුතු අන්දමින් වැඩි වීමට හේතු විය. මිල සහ අපනයන පරිමාවන් වැඩි වීම සමග කරාබුනැටි සහ සාදික්කා හා වසාවාසිවල අපනයන ඉපයීම් පිළිවෙලින් සියයට 194 කින් සහ සියයට 152 කින් වැඩි විය.

කජු අපනයනය වසර තුළදී කැපී පෙනෙන ලෙස පහත වැටුණි. මල් හට ගන්නා කාලය තුළ පැවති වර්ෂාපතනය නිසා නිෂ්පාදනය පහත වැටීමත්, දේශීය පරිභෝජනය සැළකිය යුතු ලෙස ඉහළ යාමත් නිසා අපනයනය අඩු වීමක් සිදු විය. මෙම ඌන සැපයුම් තත්ත්වය මත දේශීය කජු මිල තියුණු ලෙස වැඩි විය. කජු වගාව සඳහා 1997 දී ආරම්භ කළ සහනාධාර ක්‍රමය 1999 දීත් ක්‍රියාත්මක විය. මෙම සහනාධාර වැඩපිළිවෙල යටතේ දිස්ත්‍රික්ක 13 ක ආසන්න වශයෙන් හෙක්ටයාර 3,660 ක් වගාවට යොදන ලදී. සහනාධාර ප්‍රමාණය හෙක්ටයාරයකට රු. 8,645 වන අතර එය අවුරුදු 3 කාලසීමාවක් තුළදී නිකුත් කරනු ලැබේ.

දනට ශ්‍රී ලංකාවේ කුරුඳු තෙල් සහ පැඟිරි තෙල් නිෂ්පාදනය තරමක් විශාල වශයෙන් කෙරෙන අතර ගම්මිරිස්, සාදික්කා, වසාවාසි, කරදමුංගු, අබ සහ කරාබුනැටි වැනි කුළු බඩුවල වාෂ්පශීලී තෙල් අපනයනය සුළු වශයෙන් කෙරේ. මේවා ඉහළ අගය එකතු කළ නිෂ්පාදන වන අතර බෙහෙත් ද්‍රව්‍ය සහ සුවඳ විලවුන් කර්මාන්තය සඳහා පුළුල් වශයෙන් යොදා ගනී. අපනයන සංවර්ධන මණ්ඩලය කාබනික වගාව සඳහා නිෂ්පාදකයන්ට සහාය දුන් අතර විශේෂිත තෙල් වර්ග සහ කුළුබඩු වර්ග පිළිබඳ වෙළඳපොළවලට සහභාගී වීමට අපනයනකරුවන්ට සහාය ලබා දුනි.

මෑත කාලයේදී වාණිජ වගාවක් වශයෙන් කැපූ මල් සහ විසිතුරු පැල වගාව වර්ධනය වූ අතර මේවා අපනයනය මගින් විදේශ විනිමය උපයා ගැනීමට හොඳ හැකියාවක් ඇත. නෙදර්ලන්තය සහ ජපානය විසිතුරු පැල සඳහා ප්‍රධාන වෙළඳපොළ වේ. මේ අතර කානේෂන්, රෝස සහ ඇන්තුරියම් වැනි කැපූ මල් ජපානය සහ මැද පෙරදිග රටවලට අපනයනය කරනු ලැබීය. 1999 දී විසිතුරු පැල සහ කැපූ මල් වලින් ලද අපනයන ඉපයීම් රුපියල් දශ ලක්ෂ 573 ක් වේ. ඇන්තුරියම් වගා කරුවන්ට පරීක්ෂණ වගා වැඩසටහන් යටතේ ක්ෂේත්‍ර පුහුණුවීම් ලබා දීමෙන් සහ අපනයනකරුවන්ට අලෙවි පහසුකම් සලසා දීමෙන්ද, ප්‍රංශයේ, ජපානයේ හා එක්සත් අරාබි ජනරජයේ මල් වගා ප්‍රදර්ශණවලට සහභාගී කරවීමෙන්ද අපනයන සංවර්ධන මණ්ඩලය මල් වගා කිරීමේ අංශයට සහාය දුණි. පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය සමග එක් වී අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ඇන්තුරියම් සහ ජලජ පැලෑටි සඳහා සීඝ්‍ර ලෙස පැල ජනනය කිරීමේ වැඩපිළිවෙලක් ඇති කරන ලදී.

1999 දී කුළුබඩු සහ පැඟිරි වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය හෙක්ටයාර 91,106 දක්වා සියයට 1 කින් වැඩි වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. අළුතෙන් වගා කරන ලද හෙක්ටයාර 1,252 න් සියයට 78 ක්ම ගම්මිරිස් වගාව සඳහා යොදා ගන්නා ලදී. මෙම අංශයට සහනාධාර ලෙස දෙන ලද රුපියල් දශ ලක්ෂ 53 න් සියයට 64 ක්ම ගම්මිරිස් වගාව සඳහා මුදා හරින ලදී.

කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයෙන් 1998 සැප්තැම්බර් මසදී ආරම්භ කරන ලද දෙවැනි බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය පලතුරු, කුළුබඩු, මල් සහ විසිතුරු පැල

වාණිජකරණය කිරීමෙන්ද, මූල්‍යමය හා ශිල්පීය සහයෝගිතා යෝජනා ක්‍රමයක් මගින් ගොවීන්ට සහ සකස් කරන්නන්ටද සහාය දෙන ලදී. උතුරු සහ නැගෙනහිර පළාත්වල හැර දිස්ත්‍රික්ක 17 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. 1999 දී මෙම ව්‍යාපෘතිය විසින් තෝරා ගත් වාණිජ බැංකු මගින් රුපියල් දශ ලක්ෂ 155 ක ණය 320 ක් අනුමත කරන ලද අතර එයින් රුපියල් දශ ලක්ෂ 105 ක් මුදා හරින ලදී. මෙම ණය වලින් විශාල ප්‍රමාණයක් යොදවන ලද්දේ ගම්පහ සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල පලතුරු වගාව සඳහාය. මෙයට අමතරව මෙම ව්‍යාපෘතිය යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා රුපියල් දශ ලක්ෂ 2.3 ක් වියදම් කළ අතර කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් ව්‍යාපෘති අරමුදල් ප්‍රයෝජනයට ගනිමින් රුපියල් දශ ලක්ෂ 5.4ක් බහුවාර්ෂික බෝග හා අදාළ පර්යේෂණ කටයුතුවලට වැය කරන ලදී.


## 3.4 දේශීය කෘෂිකර්මය

### වී

වී නිෂ්පාදනය 1999 වගා වර්ෂය තුළදී සියයට 7 කින් වර්ධනය වෙමින් මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 2.9 (බුසල් දශ ලක්ෂ 137) ක උපරිම නිමැවුම් මට්ටමක් කරා ළඟා විය. මෙය 1995 දී වාර්තා වූ මීට පෙර පැවති හොඳම නිමැවුම් මට්ටම සියයට 2 කින් ඉක්මවා යාමකි. විශේෂයෙන් යල කන්නය තුළදී වපුරන ලද සහ අස්වැන්න නෙලා ගත් බිම් ප්‍රමාණය ඉහළ ගිය අතර පොහොර භාවිතය වැඩි වීම හේතුකොටගෙන සාමාන්‍ය අස්වැන්නෙහිද ඉහළ යාමක් දක්නට ලැබිණි.

1998/99 මහ කන්නය තුළදී වී නිමැවුම මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 1.7 දක්වා සියයට 2 කින් පහත වැටුණි. ඊසානදිග මෝසම් වර්ෂාව ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් මෙම කන්නය තුළ වී වපුරන ලද සහ අස්වැන්න නෙලා ගත් බිම් ප්‍රමාණයේ පහළ යැමක් සිදු විය. මෙය සුළු වාරිමාර්ග සහ වර්ෂාපෝෂිත ප්‍රදේශ සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලදී. වී අස්වැන්න නෙලීමට ආසන්න අවස්ථාවේදී උතුරුමැද සහ නැගෙනහිර පළාත්වල වූ ගංවතුර හේතුවෙන් බෝග සඳහා හානි සිදු වූ බවට වාර්තා වී ඇත. ගංවතුර හේතුකොටගෙන සිදු වූ බෝග හානිය බුසල් දශ ලක්ෂ 1.2 ක් (මෙට්‍රික් ටොන් 25,000) වශයෙන් ඇස්තමේන්තු කර ඇත.

3.4 රූප සටහන
වී නිෂ්පාදනය




පසුගිය මහ කන්නය හා සසඳනවිට සැළකිය යුතු වැඩි දියුණුවක් උතුරු පළාතේ දිස්ත්‍රික්ක පෙන්නුම් කර ඇත. යාපනය, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්කවල වී අස්වැන්න පිළිවෙලින් සියයට 28 කින්, සියයට 32 කින් සහ සියයට 93 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. භූමිතෙල් සහ පොහොර ප්‍රවාහනය සම්බන්ධයෙන් උතුරු පළාතේ සමහර දිස්ත්‍රික්කවලට සහ යාපනය අර්ධද්වීපයට පනවා තිබුණු තහංචි ඉවත් කිරීම නිසා ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු යථා තත්ත්වයට පත් විය. වගා කරන ලද බිම් ප්‍රමාණය ඉහළ යාම සමග සමහර දිස්ත්‍රික්කවල අස්වැන්න මට්ටමේ සැළකිය යුතු වැඩි දියුණුවක්ද වාර්තා විය. ඒ අනුව වවුනියාව, ත්‍රිකුණාමලය සහ යාපනය දිස්ත්‍රික්කවල වී අස්වැන්න පිළිවෙලින් සියයට 30 කින්, සියයට 28 කින් සහ සියයට 15 කින් ඉහළ ගියේය. මේ සමගම මෝසම් වර්ෂාව ප්‍රමාද වීමේ හේතුවෙන් කුරුණෑගල, අනුරාධපුරය සහ මහවැලි ' එච් ' ප්‍රදේශවල වී වගාව සඳහා සෘණාත්මක බලපෑමක් සිදු විය. මේ ප්‍රදේශවල වී නිමැවුම පිළිවෙලින් සියයට 16 කින්, සියයට 20 කින් සහ සියයට 15 කින් පහත වැටුණි.

1999 යල කන්නය තුළ පූර්ව යල කන්නයට වඩා වී නිමැවුම සියයට 23 කින් වැඩි වී මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 1.1 ක් කරා ළඟා විය. මෙය මෙතෙක් වාර්තා වුණු හොඳම යල නිමැවුම වන අතර එය 1984 වාර්තා වුණු හොඳම නිමැවුම සියයට 6 කින් ඉක්මවා යාමකි. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ මෙම කන්නය තුළදී වගා කළ බිම් ප්‍රමාණය සියයට 29 කින් ඉහළ යාමයි. පූර්ව යල කන්නය හා සසඳනවිට බදුල්ල, අම්පාර, හම්බන්තොට සහ මන්නාරම දිස්ත්‍රික්ක හැරුණුවිට අන් සියළුම දිස්ත්‍රික්කවල වී නිමැවුම 1999 යල කන්නය තුළදී වඩා හොඳ තත්ත්වයක විය. නොකඩවා හයවන වසරටත් අම්පාර දිස්ත්‍රික්කය යල කන්නයේ ඉහළම නිමැවුම පෙන්නුම් කල අතර එය මුළු යල නිෂ්පාදනයෙන් සියයට 20 ක ප්‍රමාණයක් විය. අම්පාර, පොළොන්නරුව සහ කුරුණෑගල දිස්ත්‍රික්ක තුන එකතුව වූ නිෂ්පාදනය මුළු යල නිමැවුමේ අඩකට පමණ (සියයට 47 කට) දායක විය.

වාර්ෂික සාමාන්‍ය අස්වනු මට්ටමේ ඉහළ යන ප්‍රවනතාවය නොකඩවා තුන් වන වසරටත් දක්නට ලැබුණි. සාමාන්‍ය අස්වැන්න මට්ටම හෙක්ටයාරයකට කි.ග්‍රෑ. 3,672 ක් වූ අතර මෙය 1998 වර්ෂය තුළදී වාර්තා වුණු හොඳම අස්වැන්න මට්ටමට වඩා සියයට 1 කින් වර්ධනයක් පෙන්නුම් කර ඇත.

මහ කන්නය තුළදී වූ සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට කි.ග්‍රෑ. 3,618 දක්වා සියයට 2 කින් වර්ධනය වූ අතර එය යල කන්නය තුළදී හෙක්ටයාරයකට කි.ග්‍රෑ.

3,760 දක්වා සියයට 1 කින් පහත වැටුණි. සමස්ත යල කන්නයේ අස්වැන්නේ පහත වැටීමක් වුවද පූර්ව කන්නය හා සසඳනවිට වී වගා කරන දිස්ත්‍රික්ක වලින් තුනෙන් දෙකක පමණ අස්වැන්න මට්ටම වැඩි දියුණු වී ඇත. මහ කන්නය තුළදීද දිස්ත්‍රික්ක වලින් වැඩි ප්‍රමාණයක අස්වැන්න මට්ටම පූර්ව මහ කන්නයට වඩා හොඳ තත්ත්වයක විය. මහ සහ යල කන්න දෙක තුළදී හොඳම සාමාන්‍ය අස්වැන්න ලැබුනේ උඩවලවේ ප්‍රදේශයෙනි. මහවැලි "එච්" කලාපය සාමාන්‍ය අස්වැන්න මට්ටම අනුව දෙවෙනි තත්ත්වයට පත් විය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කළ "යාය" ආදර්ශණ වැඩසටහන නොකඩවා හතර වෙනි වසරටත් පවත්වාගෙන ගියේය. පූර්ව වර්ෂයේ පවත්වන ලද ගොවීන් 16,000 ක් පමණ සහභාගී වූ ආදර්ශණ 668 හා සසඳනවිට මෙම වර්ෂය තුළදී ගොවීන් 37,000 ක් පමණ සහභාගී වූ ආදර්ශන 1,700 ක පමණ ප්‍රමාණයක් පවත්වා ඇත. මෙම ආදර්ශණ වැඩසටහනේ අරමුණ වන්නේ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා නව තාක්‍ෂණය සමග යොදා ගනු ලබන වගා පිළිවෙත් සමූහයක් හඳුන්වා දීම වේ.

මේ ආකාරයේ ආදර්ශණ වැඩසටහන් ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ධනාත්මක ලෙස දායක වී ඇත. මෙම ආදර්ශණ වැඩසටහන්වලට සහභාගී වූ ගොවීන් ලබා ගත් අස්වනු මට්ටම අනෙකුත් ගොවීන්ට වඩා සාමාන්‍ය වශයෙන් සියයට 20 - 30 ක ප්‍රමාණයකින් ඉහළ මට්ටමක විය. මෙම උපදෙස් මාලාව යටතේ නිසි කලට වගා කිරීම, පිදුරු භාවිතය සමග ගුණාත්මක වශයෙන් ඉහළ බීජ භාවිතය සහ අකාබනික පොහොර සමග කොල පොහොර භාවිතය ආදී පිළිවෙත් ඇතුළත් විය.

වර්ෂය මුළුල්ලේම වී සඳහා වූ ආකර්ශණීය මිල ගණන් හේතුවෙන් ගොවීන් අවශ්‍ය ප්‍රමාණයට පොහොර භාවිතා කළ අතර එය අස්වැන්න මට්ටම ඉහළ යාමට හේතු වූයේය. එමනිසා මහ සහ යල කන්න දෙක තුළදීම වී වගාව සඳහා පොහොර භාවිතය ඉහළ ගියේය. වගා වර්ෂය පදනම යටතේ පොහොර නිකුත් කිරීම මෙට්‍රික් ටොන් දහස් 311 දක්වා සියයට 23 කින් ඉහළ ගියේය.

පසුගිය මහ කන්නය සඳහා ප්‍රදානය කළ රුපියල් දශ ලක්‍ෂ 230 හා සසඳනවිට 1998/99 මහ කන්නය තුළදී නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (න.ස.ග්‍රා.ණ.යෝ.) යටතේ ප්‍රදානය කළ ණය මුදල රුපියල් දශ ලක්‍ෂ 208 ක් විය. 1999 යල කන්නය තුළදී ප්‍රදානය කළ ණය මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්‍ෂ 110 ක් දක්වා ආන්තිකව වැඩි විය.

වර්ෂය තුළදී ආනයනය කළ සහල් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 214,000 ක් විය. මුළු සහල් ආනයන වලින් තුනෙන් දෙකකටත් වැඩි ප්‍රමාණයක් ආනයනය කළේ නොවැම්බර් සහ දෙසැම්බර් යන මාසවලදී වූ අතර මේ කාලය තුළදී සහල් සඳහා වූ ආනයන බද්ද අඩු කරන ලදී. දේශීය සහල් මිල ස්ථායීකරන පරමාර්ථයෙන් යුතුව 1999 ඔක්තෝබර් 23 සිට 1999 දෙසැම්බර් 31 දක්වා කාලය තුළදී සහල් මත වූ ආනයන බද්ද සියයට 35 සිට සියයට 10 දක්වා පහත දමන ලදී.

**3.6 සංඛ්‍යා සටහන**
**වී වගා අංශය පිළිබඳ සංඛ්‍යා**

| අයිතමය | ඒකකය | 1998(අ) | | | 1999(ආ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 574 | 274 | 848 | 551 | 345 | 896 |
| අස්වැන්න කපාගන්නා ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 563 | 266 | 829 | 542 | 332 | 874 |
| අස්වැන්න කපාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 501 | 239 | 740 | 483 | 298 | 781 |
| නිෂ්පාදනය | මෙ.ටො.දහස් | 1,781 | 910 | 2,692 | 1,748 | 1,120 | 2,868 |
| | බුසල් දහස් | 85,345 | 43,607 | 128,952 | 83,781 | 53,681 | 137,462 |
| ඵලදාව (ඇ) | හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් | 3,555 | 3,802 | 3,634 | 3,618 | 3,760 | 3,672 |
| දෙන ලද ණය ප්‍රමාණය | රුපියල් දශලක්‍ෂ | 230 | 110 | 340 | 208 | 110 | 318 |
| සහතික මිල ක්‍රමය යටතේ මිලදී ගැනීම් | මෙ.ටො.දහස් | - | - | - | - | - | - |
| සහල් ආනයනය | මෙ.ටො.දහස් | - | - | 168 | - | - | 214 |
| (වී සමානය) | (මෙ.ටො.දහස්) | - | - | 240 | - | - | 306 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අස්වනු කැපීමේ සමීක්‍ෂණයන්ගෙන් ගත් දත්තයන් පදනම් කොටගත් ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා තොරතුරු උපයෝගී කරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක සාමාන්‍ය ඵලදාව ගණනය කරන ලදී. මුළු නිෂ්පාදනය අස්වැන්න නෙලා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය ඵලදාව ගණනය කරන ලදී.

මූලයන් : කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය
වී අලෙවි මණ්ඩලය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## අනෙකුත් ක්ෂේත්‍ර බෝග

පෙර වර්ෂයේදී මෙන්ම 1999 වසර තුළදීද අනෙකුත් ක්ෂේත්‍ර බෝග මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් වාර්තා කළේය. ලොකු ළූණු සහ රතු ළූණු දෙවර්ගයේත්, සෝයා බෝංචි, කුරක්කන් සහ අර්තාපල් වැනි බෝගවලත් නිමැවුම වැඩි වූ අතර මුං ඇට, කව්පි, උඳු සහ තල ආදී බෝගවල නිමැවුම පහත වැටුණි.

ලොකු ළූණු නිෂ්පාදනයෙහි සැළකිය යුතු දියුණුවක් පෙන්නුම් කළ අතර එය මෙට්‍රික් ටොන් 62,700 දක්වා තුන් ගුණයකටත් වඩා වැඩි වීමක් වාර්තා කළේය. මේ සඳහා දයක වූ ප්‍රධාන හේතුන් වූයේ වගා කළ බිම් ප්‍රමාණය තුන් ගුණයකින් වැඩි වීම සහ අස්වැන්න සියයට 9 කින් වැඩි වීමය. ඉන්දියාව ලොකු ළූණු අපනයනය තහනම් කිරීම නිසාත් 1998 වසර තුළ ලොකු ළූණු සඳහා සතුටුදායක මිල ගණන් පැවතීම නිසාත් මාතලේ සහ මහවැලි ' එච් ' කලාපයේ ගොවීන් 1999 වසරේ යල කන්නයේදී ලොකු ළූණු වගා කරවීමට පොළඹවනු ලැබීය. මාතලේ දිස්ත්‍රික්කයේ සහ මහවැලි ' එච් ' කලාපයේ ගොවීන් එක්ව මුළු ලොකු ළූණු වගාවෙන් සියයට 80 ක භූමි ප්‍රමාණයකට දයක වූ අතර ඉතිරි කොටස වගා කරන ලද්දේ අනුරාධපුර සහ පොළොන්නරු දිස්ත්‍රික්කවලය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් යල කන්නය තුළදී නිෂ්පාදනයෙහි අතිරික්තයක් ඇති වූ අතර සමහර ගොවීන්ට තම නිෂ්පාදන අලෙවි කර ගැනීමේ දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදු විය. සමූපකාර තොග වෙළඳ සංස්ථාව මැදිහත් වී දේශීය වෙළඳපොළේ ලොකු ළූණු මිලදී ගනු ලැබිණ. නිමැවුම වැඩි වීම නිසා ලොකු ළූණු ආනයනය ආසන්න වශයෙන් මෙට්‍රික් ටොන් 84,000 දක්වා සියයට 16 කින් අඩු විය.

පසුගිය වසරේදී පැවති පහත් නිෂ්පාදන මට්ටමට සාපේක්ෂකව අර්තාපල් නිෂ්පාදනය 1999 වර්ෂය තුළදී සියයට 5 ක වර්ධනයක් පෙන්නුම් කළේය. එයින් පෙනී යන්නේ ආනයන බලපත්‍ර අවශ්‍යතාවය ඉවත් කිරීමත් සමග අර්තාපල් වගා අංශය ක්‍රමයෙන් එම තත්ත්වයන්ට සරිලන සේ හැඩ ගැසුන බවයි. වගා කළ බිම් ප්‍රමාණය පහත වැටී තිබියදීද අස්වනු මට්ටම වැඩි වීම මත අර්තාපල් නිමැවුම වැඩි විය. 1996 දී ආනයන තහනම ඉවත් කිරීමත් සමග අර්තාපල් වගා කළ බිම් ප්‍රමාණය අඩු වෙමින් පවතින අතර එය 1999 අවසානය වනවිට හෙක්ටයාර 2,171 දක්වා සියයට 7 කින් තවදුරටත් අඩු විය.

කුරක්කන් සෞඛ්‍යසම්පන්න ආහාරයක් ලෙස ක්‍රම ක්‍රමයෙන් ජනප්‍රිය වෙමින් පවතී. කුරක්කන් වගා කළ බිම් ප්‍රමාණය නොකඩවා දෙවන වසරටත් සියයට 6 කින් වැඩි වූ අතර නිෂ්පාදනය 1999 වසර තුළදී සියයට 9 කින් වැඩි විය. තල නියඟයට ඔරොත්තු දෙන බෝගයක් වන අතර පහතරට වියළි කලාපීය දිස්ත්‍රික්කවල මනාව පැතිර පැවති වර්ෂාපතනය නිසා තල වගා කරන ලද බිම් ප්‍රමාණය අඩු විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් තල නිෂ්පාදනය සියයට 16 කින් පහත වැටුණි. කොලෙස්ට්‍රෝල් රහිත වීම නිසා තල තෙල් සඳහා දේශීය වශයෙන් ඉහළ ඉල්ලුමක් පවතී. එමෙන්ම තල සඳහා දියුණු කළහැකි ඉහළ අපනයන වෙළඳපොළක්ද පවතී. අපනයන වෙළඳපොළේ ඉල්ලුම විශේෂයෙන් සුදු තල සඳහා වන අතර දේශීය වශයෙන් ජනප්‍රිය වනුයේ කළු හෝ මිශ්‍ර බීජ වේ. තල පරපරාගණයට භාජනය වන බැවින් තනිකරම සුදු තල, නිෂ්පාදනය කළු තල ඇටද වගා කරන ප්‍රදේශවල පවත්වාගෙන යෑම දුෂ්කර වේ.

බඩ ඉරිඟු සත්ව ආහාර සඳහා යොද ගන්නා ප්‍රධාන අමු ද්‍රව්‍යයක් වන අතර දේශීය වශයෙන් ඉහළ ඉල්ලුමක් පවතී. කෙසේ වෙතත් 1999 දී බඩ ඉරිඟු වගා කළ බිම් ප්‍රමාණය සහ නිමැවුම පිළිවෙළින් සියයට 3 කින් සහ සියයට 6 කින් පහත වැටුණි. කුකුල් කෑම පිළියෙල කිරීමේදී ප්‍රධාන යෙදවුමක් වශයෙන් බඩ ඉරිඟු භාවිතා කරයි. වෙනත් බොහෝ කෘෂිකාර්මික නිෂ්පාදනයන්ට මෙන් බඩ ඉරිඟුවලටද තීරු බදු ආවරණයක් නැත. මෙම තත්ත්වය කුකුළු ගොවිපල කර්මාන්තයට රුකුලක් වූ අතර දේශීය බඩ ඉරිඟු ගොවීන්ට අවාසියක් විය. මෙම තත්ත්වය සැළකිල්ලට ගනිමින් වසර 2000 අයවැය ලේඛනයෙන් බඩ ඉරිඟු ආනයනයන් මත සියයට 5 ක තීරු බද්දක් හඳුන්වා දෙනු ලැබීය. වසර තුළ ආනයන කළ බඩ ඉරිඟු ප්‍රමාණය ආසන්න වශයෙන් මෙට්‍රික් ටොන් 128,000 ක් වූ අතර මෙයින් පෙන්නුම් කරන්නේ දේශීය සැපයුම විශාල වශයෙන් පහත වැටී ඇති බවය.

## එළවළු සහ පලතුරු

1999 වර්ෂය තුළ එළවළු නිෂ්පාදනය සියයට 6 කින් වර්ධනය වී ඇති බව ලැබී ඇති මූලික ඇස්තමේන්තුවලට අනුව පෙනී යයි. ඇස්තමේන්තුගත මුළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 554,641 ක් වේ. ගෝවා, කැරට්, ලීක්ස්, තක්කාලි සහ බීට් වැනි උඩරට එළවළු වර්ග බදුල්ල, නුවරඑළිය දිස්ත්‍රික්කවල බහුල වශයෙන් වගා කරනු ලැබේ. අර්තාපල් වෙනුවට වැඩි වශයෙන් එළවළු වගා කිරීමට ගොවීන් තුළ ඇති වැඩි කැමැත්ත පිළිබිඹු කරමින් උඩරට එළවළු නිෂ්පාදනය සියයට 10 කින් වර්ධනය විය. ඒ හා සමානව වගා කළ බිම් ප්‍රමාණයේද වර්ධනයක් දකිය හැකි වේ. වම්බටු, බණ්ඩක්කා, කරවිල, පතෝල සහ වට්ටක්කා වැනි පහතරට එළවළු වර්ග හම්බන්තොට, මාතලේ, රත්නපුර සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල යල හා මහ කන්න දෙකේම බහුල වශයෙන් වගා කෙරේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් පහත රට එළවළු නිෂ්පාදනයේද සියයට 5 ක වර්ධනයක් පෙන්නුම් කළේය. 1999 සැපයුමේ වර්ධනය හේතුකොට මිල මට්ටම පහත වැටුණු අතර 1998 ට වඩා ස්ථාවර තත්ත්වයක පැවතිණි. මැදපෙරදිග, මාලදිවයින සහ යුරෝපා රටවල වෙළඳපළවලට අළුත් එළවළු, අර්ධ වශයෙන් සකස් කළ සහ සම්පූර්ණයෙන් සකස් කළ එළවළු අපනයනය කෙරේ. ලීක්ස්, මාළු මිරිස් සහ මිශ්‍ර එළවළු ප්‍රධාන වශයෙන් අපනයනය කරනු ලබන අළුත් එළවළු අතරට ගැනේ. අර්ධ වශයෙන් සකස් කළ හා පූර්ණ ලෙස සකස් කළ අපනයන එළවළු අතර ප්‍රධාන වන්නේ "ගර්කින්" ය. ජපානය පූර්ණ වශයෙන් සකස් කළ "ගර්කින්" සඳහා ප්‍රධාන වෙළඳපළ විය.

අන්නාසි සහ කෙසෙල් හැරුණවිට ශ්‍රී ලංකාවේ පළතුරු වගාව වාණිජමය මට්ටමකින් සිදු නොවේ. ගම්පහ සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල අන්නාසි වගාව වාණිජමය පදනමකින් වසර පුරාම වගා කරන අතර හම්බන්තොට සහ රත්නපුර දිස්ත්‍රික්කවල කෙසෙල් වගා කෙරේ. දේශීය සහ විදේශීය පාරිභෝගිකයින්ගේද වැඩි ඉල්ලුමක් ඇති වාරයකට පමණක් සීමා වූ පළතුරු අතර අඹ, රඹුටන්, මැංගුස්ටින් සහ දූරියන් වැදගත් තැනක් ගනී.

සියඹලාද ඇතුළුව අළුත් සහ වියළි පළතුරු මෙට්‍රික් ටොන් 7,000 කට ආසන්න ප්‍රමාණයක් 1999 වසර තුළ අපනයනය කර ඇත. මෙමගින් ලැබූ අපනයන ආදායම රුපියල් දශ ලක්ෂ 476 ක් වේ. අන්නාසි ප්‍රධාන අපනයන පළතුරක් වන අතර අඹ, පැපොල්, අලිගැටපේර, කොමඩු ස්වල්ප වශයෙන් මැද පෙරදිග, මාලදිවයින සහ යුරෝපයට අපනයනය කරන ලදී. පළතුරු යුෂ, ජෙලි, ජෑම්, මාමලේඩ් සහ අනෙකුත් ටින් කළ පළතුරු වර්ගද ඉහත කී රටවල වෙළඳපළවලට යවනු ලැබිණි. යම් ප්‍රමාණයක දේශීය පළතුරු වර්ග, ජෑම්, කෝඩියල්, චට්නි සහ පිළිගැන්වීමට පහසු ලෙස සකස් කළ බීම වර්ග ලෙස දේශීය වෙළඳපළට සපයනු ලැබේ. සකස් කළ එළවළු සහ පළතුරු සඳහා දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළේද හොඳ විභවයක් පවතී. කෙසේ වෙතත් අධික එලද සමයේ නිෂ්පාදන මතුවට ප්‍රයෝජන ගතහැකි සේ ඇසුරුම් කිරීමේ ක්‍රම කෙරෙහි යටිතල පහසුකම්වල ඌනතාවය අහිතකර ලෙස බලපා ඇත. මේ නිසා නිෂ්පාදකයා සහ ඇසුරුම් කරන්නා අතර යෝග්‍ය ආකාරයේ සම්බන්ධයක් ගොඩ නැගී නැත. මෑතදී හඳුන්වා දුන් " ගොවි සහනය " යටතේ කෘෂි නිෂ්පාදන සඳහා විධිමත් ඉදිරි වෙළඳපළවල් දියුණු කිරීම මගින් කෘෂි වෙළඳපළ ජාලයක් වැඩි දියුණු කිරීම සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමක්ද හඳුන්වා දීමට අපේක්ෂා කෙරේ.

1999 වසරේදී පළතුරු ආනයනයේද සැළකිය යුතු වර්ධනයක් දක්වෙන අතර පසුගිය සිව් වසර තුළදී ආනයනික පරිමාව දෙගුණයකටත් වඩා වැඩි වී ඇත. ශ්‍රී ලංකාව 1999 වසරේ පළතුරු මෙට්‍රික් ටොන් 40,000 ක ආනයනය කර ඇති අතර වටිනාකම රුපියල් දශ ලක්ෂ 1,000 ක් වේ. එය 1998 වසරේ ආනයනික පරිමාවට වඩා සියයට 43 ක වැඩි වීමකි. ඇපල්, රට ඉඳි, මිදි සහ දෙඩම් ප්‍රධාන ආනයනික පළතුරු අතර වේ.

**සීනි**

1999 සීනි නිෂ්පාදනය 1998 ට වඩා සියයට 6 කින් ඉහළ ගොස් මෙට්‍රික් ටොන් 65,220 ක් විය. පසුගිය වර්ෂයේදී මෙන් මෙම වර්ෂය තුළදීද සීනි නිෂ්පාදනය කරනු ලැබුවේ සෙවනගල සහ පැල්වත්ත කම්හල්වල පමණි. හිඟුරාණ කම්හල නොකඩවා දෙවන වසරටත් වසා තිබුණි. පැල්වත්ත කම්හලේ නිමැවුම සියයට 9 කින් වර්ධනය වීමේ හේතුවෙන් සමස්ත නිෂ්පාදනය ඉහළ ගියේය. මෙය 1986 දී ආරම්භ කළ දින සිට පැල්වත්ත කම්හල ලබා ගත් දෙවන ඉහළ නිෂ්පාදන මට්ටම විය. සෙවනගල කම්හලේ නිෂ්පාදනය නෙලා ගත් උක් දඬු අස්වැන්නේ පහළ යාම හේතුකොටගෙන වර්ෂය තුළදී සියයට 2 කින් පහත වැටුණි.

පැල්වත්ත සාමාන්‍ය අස්වැන්න සියයට 27 කින් තවදුරටත් වැඩි දියුණු වී 1999 තුළදී හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 56 ක් විය. වර්ෂය තුළ පැවැති යහපත් කාලගුණික තත්ත්වය පැල්වත්තේ අස්වැන්න වර්ධනය සඳහා බලපාන ලදී. සෙවනගල සාමාන්‍ය අස්වැන්න සියයට 3 කින් පහත වැටී හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 79 ක් විය. එහෙත් සෙවනගල සාමාන්‍ය ඵලදාව පැල්වත්තට වඩා ඉහළ මට්ටමක පවතින අතර එයට හේතුව වූයේ සෙවනගල උක් බිම් වාරි පහසුකම් වලින් යුක්ත ඒවා වන අතර පැල්වත්ත ප්‍රධාන වශයෙන් වර්ෂාපෝෂිත වගාවෙන් යුක්ත වීම වේ.


1999 දී උක් දඬු අඹරා ගත් මුළු ප්‍රමාණය සියයට 2 කින් ඉහළ ගොස් මෙට්‍රික් ටොන් දහස් 745 ක් විය. සමස්ත නිෂ්පාදනයේ ඉහළ යාමට මූලික වශයෙන් හේතු වූයේ පැල්වත්තේ උක් දඬු අඹරන ලද ප්‍රමාණය සියයට 4 කින් ඉහළ යාමය. පසුගිය වර්ෂය හා සසඳනවිට සෙවනගල උක් දඬු අඹරන ලද ප්‍රමාණය සියයට 3 කින් පහත වැටී 1999 දී මෙට්‍රික් ටොන් දහස් 192 ක් විය. පැල්වත්ත කම්හලේ අඹරන ලද උක් දඬු වලින් හරි අඩක්ම පමණ (සියයට 49 ක්) පෞද්ගලික මිලදී ගැණුම් වලින් යුක්ත වූ අතර සෙවනගල කම්හලේ අඹරන ලද උක් දඬු වලින් සියයට 1 ක් පමණ පෞද්ගලික මිළදී ගැණුම් වලින් යුක්ත විය. සෙවනගල සහ පැල්වත්ත යන කම්හල් දෙකේම සීනි ලබා ගැනීමේ ප්‍රතිශතයන් පසුගිය වර්ෂයට වඩා වැඩි දියුණු වූයේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමස්ත සීනි ලබා ගැනීමේ ප්‍රතිශතය 1998 දී සියයට 8.37 වූ අතර 1999 දී මෙය සිට 8.74 දක්වා ඉහළ ගියේය.

සීනි කර්මාන්තය මගින් අම්පාර, මොණරාගල, බදුල්ල දිස්ත්‍රික්කවල විශාල සංඛ්‍යාවකට සේවා නියුක්ති අවස්ථාවන් සැපයේ. කම්හල් දෙකේ සෘජු සේවා නියුක්තිය සෙවනගල සහ පැල්වත්ත උක් ඉඩම්වල කාලීන සහ අනියම් ශ්‍රමිකයන්ද ඇතුළත්ව 15,000 ක් පමණ වේ. මේ අතර තවත් පවුල් 30,000 ක් පමණ කුඩා වගාකරුවන් වශයෙන් උක් වගාවේ නියුක්ත වී ඇත.

මෙම තත්ත්වය යටතේ වුවද දේශීය සීනි නිෂ්පාදනය මුළු පරිභෝජනයෙන් සියයට 15 කට වඩා අඩු ප්‍රමාණයක් සපුරාලීම සඳහා ප්‍රමාණවත් වේ. දේශීය සැපයුමේ ඌණතාවය වර්ෂය තුළදී මෙට්‍රික් ටොන් දහස් 479 ක් ආනයනය මගින් සපුරා ගන්නා ලදී. සීනි සඳහා වූ ජාත්‍යන්තර සාමාන්‍ය මිල වර්ෂය තුළ සියයට 9 කින් පහත වැටී එක්සත් ජනපද ඩොලර් 222 ක් වූයේය. කෙසේ වෙතත්, දේශීය වෙළඳපොළේ සීනි සඳහා වූ සිල්ලර මිල සියයට 12 කින් පමණ පහත වැටුණේය. දැනට මෙට්‍රික් ටොන් 1 කට රුපියල් 3,500 ක් වන ආනයන තීරු බද්ද මගින් දේශීය සීනි කර්මාන්තය දැඩි වශයෙන් ආරක්ෂා කර ඇත. මෙම ආරක්ෂණ තත්ත්වය පැවතියද කලාපයේ අනෙකුත් රටවල් හා සසඳනවිට ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තයේ මූල්‍යමය පැවැත්ම ඉහළ

නිෂ්පාදන පිරිවැය හේතුවෙන් දැඩි තර්ජනයකට ලක් වී ඇත. පහළ මට්ටමේ පවතින සීනි ලබා ගැනීමේ අනුපාතය සහ ඉහළ මට්ටමක වන කම්හල් මත මූලික පිරිවැය අධික නිෂ්පාදන පිරිවැය සඳහා හේතු වී ඇත. ඉන්දියාවේ සීනි ලබා ගැනීමේ අනුපාතය (සියයට 10 කට වැඩි) ශ්‍රී ලංකාවේ එම අනුපාතයට වඩා විශාල වශයෙන් ඉහළ මට්ටමක වේ. සීනි ලබා ගැනීමේ අනුපාතයන් සෘජු වශයෙන් උක් දඬුවල අඩංගු සීනි ප්‍රමාණය සහ සැකසුම් කාර්යක්‍ෂමතාවය අනුව තීරණය වේ. දේශීය උක් දඬුවල අඩංගු සීනි ප්‍රමාණය පහළ මට්ටමක වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ දුර්වල ක්ෂේත්‍ර කළමණාකරණයයි. උක් දඬුවල ගුණාත්මක අගය වැඩි දියුණු කිරීමේදී බලපා ඇති ප්‍රධාන බාධකයක් වී ඇත්තේ උක් දඬු සඳහා පවතින මිල නියම කිරීමේ ආකාරයයි. වර්තමානයේදී පැල්වත්ත කම්හලේ උක් දඬු සඳහා ගෙවීම් කරනු ලබන්නේ බර ප්‍රමාණය අනුව වේ. සෙවනගල කම්හලේ උක් දඬු සඳහා ගෙවීම් ගුණාත්මක පදනමක් අනුව තීරණය කළද, එයද සමස්ත කන්නයේ සාමාන්‍යය අනුව නියම කරන බැවින් වගාකරුවන්ගේ උක් දඬුවල ගුණාත්මක අගයන් වෙන වෙනම හඳුනා ගනු නොලැබේ. මිලදී ගනු ලබන අවස්ථාවේදී ඉහළ සීනි ප්‍රමාණයක් අඩංගු සහ පහළ සීනි ප්‍රමාණයක් අඩංගු උක් දඬු වශයෙන් පැහැදිලි වෙනසක් සිදු කරන්නේ නැත. එමනිසා පුද්ගලික උක් දඬු වගාකරුවන් හට යහපත් ක්ෂේත්‍ර කළමනාකරණය යටතේ තම උක් දඬුවල ගුණාත්මක භාවය ඉහළ නංවාලීමට දිරි ගැන්වීමක් නොමැත.

**3.5 රූප සටහන**
**සීනි සැපයුම**




**3.7 සංඛ්‍යා සටහන**
**සීනි නිෂ්පාදන අංශය පිළිබඳ සංඛ්‍යා**

| අයිතමය | ඒකකය | සෙවනගල සීනි කම්හල 1998(අ) | සෙවනගල සීනි කම්හල 1999(ආ) | පැල්වත්ත සීනි කම්හල 1998(අ) | පැල්වත්ත සීනි කම්හල 1999(ආ) | එකතුව 1998(අ) | එකතුව 1999(ආ) |
|---|---|---|---|---|---|---|---|
| 1. උක් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය (නිරිවගාව ඇතුළුව) (ඇ) | හෙක්ටයාර | 2,950 | 3,314 | 4,470 | 4,662 | 8,543 | 7,976 |
| 2. උක්දඬු කපාගත් බිම් ප්‍රමාණය(ඇ) | හෙක්ටයාර | 2,423 | 2,413 | 3,928 | 3,712 | 6,350 | 6,125 |
| 3. කපාගත් උක්දඬු ප්‍රමාණය(ඇ) | මෙට්‍රික් ටොන් දහස් | 195 | 190 | 174 | 209 | 369 | 399 |
| 4. පෞද්ගලික අංශයෙන් මිලට ගත් උක්දඬු ප්‍රමාණය | මෙට්‍රික් ටොන් දහස් | 2 | 2 | 358 | 344 | 360 | 346 |
| 5. අඹරන ලද උක්දඬු ප්‍රමාණය | මෙට්‍රික් ටොන් දහස් | 197 | 192 | 532 | 553 | 729 | 745 |
| 6. සාමාන්‍ය ඵලදාව (ඇ) | හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් | 81 | 79 | 45 | 56 | 58 | 65 |
| 7. නිෂ්පාදනය කළ සීනි ප්‍රමාණය(අපතේ යන සීනි හැර) | මෙට්‍රික් ටොන් දහස් | 17 | 17 | 44 | 49 | 61 | 66 |
| 8. සීනි ලබාගැනීමේ ප්‍රතිශතය (ඈ) | % | 8.65 | 8.70 | 8.35 | 8.77 | 8.37 | 8.74 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) කේන්ද්‍රීය වගාවන් සහ බිම් කට්ටිකරුවන් සතු වගාවන්ද ඇතුලත් වේ.
(ඈ) සීනි ලබාගැනීමේ ප්‍රතිශතය = (නිෂ්පාදනය කළ සීනි ප්‍රමාණය / අඹරන ලද උක්දඬු ප්‍රමාණය) x 100

මූලයන් : සීමාසහිත පැල්වත්ත සීනි කර්මාන්තායතනය
සීමාසහිත සෙවනගල සීනි කර්මාන්තායතනය

## 3.5 ධීවර සහ පශු සම්පත්

### ධීවර

ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශයේ ඇස්තමේන්තුවලට අනුව වසර තුළ මුහුදු ධීවර සහ මිරිදිය ධීවර යන අංශ දෙකෙහිම සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය දළ වශයෙන් මෙට්‍රික් ටොන් 280,000 දක්වා පසුගිය වසරට සාපේක්ෂව සියයට 8 කින් ඉහළ ගියේය. මුළු මුහුදු මත්ස්‍ය නිෂ්පාදනයෙන් තුනෙන් එකක් පමණ ලැබෙන අක්වෙරළ හා ගැඹුරු මුහුදු අංශයෙහි මත්ස්‍ය නිෂ්පාදනය පසුගිය වසරට සාපේක්ෂව සියයට 20 ක්ව සැළකිය යුතු වර්ධනයක්

පෙන්නුම් කෙරිණ. එක් දින සහ බහු දින ධීවර බෝට්ටු, සම්ප්‍රදායික යාත්‍රා, පිටසවි මෝටර් සහ මසුන් ඇල්ලීමේ උපකරණ සැපයීම වැනි මාර්ග වලින් ධීවරයින්ට ලැබුණු සහන ඉහළ යාම මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ යෑමට බලපෑ ප්‍රධාන සාධකය විය. මේ අතර වෙරළාසන්න සහ මිරිදිය හා ජලජීවී අංශයන්හි මත්ස්‍ය නිෂ්පාදනයද පසුගිය වසරට සාපේක්ෂව පිළිවෙලින් සියයට 3 කින් සහ සියයට 5 කින් වර්ධනය විය.

ධීවර අංශය ශ්‍රී ලංකා ආර්ථිකයෙහි ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. දශ ලක්ෂයකට ආසන්න පිරිසකගේ ප්‍රධාන ජීවනෝපාය ධීවර කර්මාන්තය වන අතර එය රටේ ජනතාවගේ මන්දපෝෂණය තුරන් කිරීමටද උපකාරී වෙයි. ශ්‍රී ලංකාව ධීවර සම්පතින් පොහොසත් රටකි. කිලෝ මීටර් 1,700 ක් පමණ වූ වෙරළ තීරයක්ද, වෙරළෙහි සිට කිලෝ මීටර් 200 ක් ඈතට විහිදෙන වර්ග කිලෝ මීටර් 500,000 කටත් වඩා අයත් වන සාගර ප්‍රදේශයකින් සමන්විත බාහිර ආර්ථික කලාපයක්ද එයට අයත්ය. ධීවර කර්මාන්තය සඳහා සම්ප්‍රදායිකව යොදා ගනු ලැබුවේ බාහිර ආර්ථික කලාපයට අයත් මුහුදු තීරයෙන් අටෙන් එකකටත් වඩා අඩු වර්ග ප්‍රමාණයක වෙරළාසන්න මුහුදු තීරයකි.

ධීවර කර්මාන්තය නැංවීම පිණිස රටෙහි විශාල විභවයක් පැවතියද කරවල සහ ටින් මාලු විශාල පරිමාණයෙන් තවමත් රට තුළට ආනයනය කෙරේ. 1998 වසරෙහි ආනයනය කළ මත්ස්‍ය නිෂ්පාදනවල වටිනාකම වූ රුපියල් දශ ලක්ෂ 3,923 ට සාපේක්ෂව 1999 වසර තුළ රුපියල් දශ ලක්ෂ 3,933 ක මත්ස්‍ය නිෂ්පාදන ආනයනය කරනු ලැබීය. බහුල මුහුදු ධීවර සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම ඉලක්ක කර ගනිමින් ගැඹුරු මුහුදේ මසුන් මැරීම දිරිමත් කිරීම සඳහා රජය විසින් මූලික පියවර ගෙන ඇත. ගැඹුරු මුහුදේ දිගුකලක් ගත කළහැකි වඩාත් දියුණු ශීත ගබඩා පහසුකම් වලින් සමන්විත බහු දින ධීවර බෝට්ටු භාවිතය ඉහළ නැංවීම මගින් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා දායක වී ඇත. මේ අනුව "නිෂ්පාදන සහනාධාර යෝජනා ක්‍රමය" යටතේ පසුගිය වසරෙහි ධීවර නිෂ්පාදකයින්ට ලබා දුන් බහු දින ධීවර යාත්‍රා 44 ට සහ එක් දින ධීවර යාත්‍රා 56 ට සාපේක්ෂව මෙම වසරෙහිදී බහු දින ධීවර යාත්‍රා 56 ක් සහ එක් දින ධීවර යාත්‍රා 233 ක් ලබා දෙන ලදී. මීට අමතරව සම්ප්‍රදායික ධීවර යාත්‍රා 459 ක් සහ මසුන් මැරීමේ යාන්ත්‍රික කට්ටල 577 ක්ද මෙම යෝජනා ක්‍රමය යටතේම මේ වසර තුළදී ධීවරයින්ට ලබා දෙන ලදී. මේ හැරුණුවිට ධීවර කර්මාන්තයට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වසර තුළ විශාල මුදල් ප්‍රමාණයක් ආයෝජනය කරන ලදී. මේ යටතේ ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රතිපාදන මත ලංකා ධීවර වරාය සංස්ථාවේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක වන " ධීවර අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය" මගින් කුඩාවැල්ල, හික්කඩුව සහ පානදුර යන ස්ථානවල නව ධීවර වරාය 3 ක් දනට ඉදි වෙමින් පවතී. මේ අතර බේරුවල, මිරිස්ස සහ පුරාණවැල්ල යන ධීවර වරායයන් වැඩි දියුණු කරනු ලැබූ අතර, එම වරායයන් සඳහා අත්‍යාවශ්‍ය වෙරළාශ්‍රිත පහසුකම් සහ සේවාවන් සම්පාදනය කරන ලදී.

මිරිදිය සහ ජලජීවී ධීවර අංශය දියුණු කිරීමට ඇති ඉඩකඩ හඳුනාගෙන ඇති රජය ඒ සඳහා 1999 ජනවාරි 29 දින " ජාතික ජලජීවී සංවර්ධන අධිකාරිය" ස්ථාපනය කරනු ලැබීය. රට තුළ ජලජීවී සම්පත් කළමනාකරණය කිරීම සහ සංවර්ධනය කිරීම අධිකාරියෙහි වගකීම වේ. ඒ අනුව ක්‍රියාත්මක කළ ජලජීවී සංවර්ධන ව්‍යාපෘති සහ ජන සහභාගිත්ව කුඩා ව්‍යාපෘති මගින් බෝ කරනු ලැබූ ඇඟිල්ලන් (කුඩා මසුන් පැටවුන්) දශ ලක්ෂ 3 ඉක්මවූ ප්‍රමාණයක් ග්‍රාමීය වැව් 80 කට මුදා හරිනු ලැබීය.

**3.8 සංඛ්‍යා සටහන**
**මත්ස්‍ය නිෂ්පාදනය**

මෙට්‍රික් ටොන් දහස්

| අනු අංශ | 1997 | 1998(අ) | 1999(ආ) |
|---|---|---|---|
| මුහුදු මත්ස්‍ය(ඇ) | 213 | 240 | 248 |
| ජලජීවී (ඈ) | 27 | 30 | 31 |
| එකතුව | 240 | 270 | 280 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුහුදු බඩ හා ගැඹුරු මුහුදු ධීවර අංශයන්
(ඈ) මිරිදිය මත්ස්‍ය අංශය, වෙරළබඩ කලපු ජලයෙහි ඉස්සන් සහ වගා කරන ලද ඉස්සන් නිෂ්පාදනයද ඇතුලත් වේ

මූලය : ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

කෙසේ වෙතත් මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන අපනයනයෙහි ප්‍රමාණය සහ වටිනාකම පිළිවෙලින් සියයට 14 කින් සහ සියයට 24 කින් වසර තුළදී පහත වැටුණි. විශේෂයෙන් බස්නාහිර සහ වයඹ පළාත්වල ඉස්සන් වගාවට වැළඳුනු සුදු පුල්ලි සහ හිස කහ පාට වීමේ රෝග හේතුකොටගෙන ඉස්සන් අපනයනය සැළකිය යුතු ප්‍රමාණයකින් පහත වැටීම මේ තත්ත්වයට බලපෑ ප්‍රධාන හේතුව විය. ලන්දේසි ඇලෙහි ජලධාරිතාවයට ඔරොත්තු නොදෙන තරම් ඉස්සන් කොටු බිහි වීම සහ පාරිසරික රෙගුලාසි බරපතල ලෙස උල්ලංඝනය කිරීමේ හේතුවෙන් ඉහත රෝගය සීඝ්‍රව ව්‍යාප්ත විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස වසර තුළ ඉස්සන් ගොවිපලවල් සැහෙන ප්‍රමාණයක් වසා දමන ලදී. ඉස්සන් වගාව විශාල ලාභ උපදවන ව්‍යාපාරයක් වේ. එහි ප්‍රතිඵලය වූයේ වසර කීපයක් තුළ අනවසර ඉස්සන් ගොවිපල විශාල ප්‍රමාණයක් බිහි වීමයි. දනට ඉස්සන් ගොවිපලවල් 1,300 කට වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක වන අතර, මෙවායින් භාගයක් පමණ (සියයට 48 ක්) අනවසර ගොවිපලවල් වේ.

පුළුල් කළහැකි ඉහළ ශක්‍යතාවයකින් යුත් තවත් අංශයක් නම් සුරතල් මසුන් බෝ කිරීම සහ අපනයනය කිරීම වේ. විශාල ආර්ථික වාසි මෙන්ම සැළකිය යුතු රැකියා අවස්ථා සැලසිය හැකි අංශයක් ලෙස සලකා මෙම අංශය දියුණු කිරීම පිණිස අදාළ පියවර ගතයුතුව ඇත. පසුගිය වසරෙහි ලැබූ ආදායමට වඩා සියයට 6 ක වර්ධනයක්

පෙන්නුම් කරමින් මෙම වසර තුළ සුරතල් මසුන් අපනයනය කිරීමෙන් ලැබූ ආදායම රුපියල් දශ ලක්ෂ 559 ක් විය. ජපානය, ඇමෙරිකා එක්සත් ජනපදය, ජර්මනිය සහ ප්‍රංශය යන රටවල් සුරතල් මසුන් සඳහා ප්‍රධාන වෙළඳපොළවල්ය. ජාත්‍යන්තර වෙළඳපොළට සැපයෙන මුළු සුරතල් මත්ස්‍ය සැපයුමෙන් ශ්‍රී ලංකාවේ අපනයන දායකත්වය සියයට 1 ටත් වඩා අඩුය. මෙමගින් පෙන්නුම් කෙරෙනුයේ ශ්‍රී ලංකාව තුළ මෙම කර්මාන්තය තවදුරටත් පුළුල් කළහැකි බවයි.

ධීවර ප්‍රජාවගේ පහත් ජීවන තත්ත්වය සැළකිල්ලට ගෙන ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ධීවර නිවාස යෝජනා ක්‍රම 4 ක් ක්‍රියාත්මක කොට ඇත. මේ යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහයෝගය ඇතිව "දියවර ගම්මාන" නිවාස වැඩසටහන, "දියවරපුර" නිවාස යෝජනා ක්‍රමය, "විසිරි නිවාස" නිවාස වැඩසටහන සහ ධීවර නිවාස ව්‍යාපෘතිය යන ව්‍යාපෘති 4 ක් යටතේ දනටමත් නිවාස ඒකක 20,000 ඉක්මවූ ප්‍රමාණයක් ඉදි කරනු ලැබ ඇත. 90,000 ටත් වැඩි පිරිසක් මේ වනවිටත් මෙම වැඩසටහන් යටතේ සහන ලබා ඇත.

මීට අමතරව අමාත්‍යාංශය මගින් වසර තුළ තවත් සංවර්ධන වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරනු ලැබීය. මීගමුව මත්ස්‍ය ජාන බැංකුව පිහිටුවීම, හම්බන්තොට ධීවර කෞතුකාගාරයක් පිහිටුවීම, ධීවරයින්ට චන්ද්‍රිකා සංනිවේදනය පිළිබඳ පුහුණුවක් ලබා දීම, වෙරළ සංරක්ෂණ කටයුතු සඳහා වෙරළාරක්ෂකයින් 200 ක් පත් කිරීම ආදිය එයට ඇතුළත්ය.

## පශු නිෂ්පාදන

පශු නිෂ්පාදන අංශය මූලික වශයෙන් කිරිපට්ටි පාලනය සහ කුකුලන් ඇති කිරීම යන අනු අංශ දෙකකින් සමන්විත වේ. කිරිපට්ටි පාලන අංශයෙහි එළකිරි නිෂ්පාදනය මෙන්ම මී කිරි නිෂ්පාදනයද 1999 වසර තුළ පිළිවෙලින් ලීටර් දශ ලක්ෂ 260 ක් සහ ලීටර් දශ ලක්ෂ 82 ක් දක්වා සියයට 2 ක වර්ධනයක් පෙන්වීය. ප්‍රධාන කිරි සැකසුම් සමාගම් වන සීමාසහිත කිරියා කිරි නිෂ්පාදන සමාගම, සීමාසහිත නෙස්ලේ ලංකා සමාගම, ජාත්‍යන්තර කිරි නිෂ්පාදන සමාගම සහ අනෙකුත් කිරි සැපයුම්කරුවන් විසින් වසර තුළ එකතු කරනු ලැබූ කිරි ප්‍රමාණය ලීටර් දශ ලක්ෂ 109 ක් වූ අතර, පසුගිය වසරට සාපේක්ෂව එය සියයට 5 ක අඩු වීමක් පෙන්නුම් කරයි. මෙම අඩු වීමට හේතුව වූයේ සීමාසහිත කිරියා කිරි නිෂ්පාදන සමාගමෙහි ඇති වූ කම්කරු ආරවුල හේතුකොටගෙන එම සමාගමේ කිරි එකතු කිරීමේ වැඩසටහනට බාධා ඇති වීමයි. කෙසේ වුවද, එකතු කරනු ලැබූ සමස්ත කිරි ප්‍රමාණයෙන් සියයට 43 ක් කිරියා සමාගම විසින්ද, පිළිවෙලින් සියයට 26 ක් සහ සියයට 11 ක් නෙස්ලේ ලංකා සමාගම සහ ජාත්‍යන්තර කිරි නිෂ්පාදන සමාගම විසින්ද එකතු කරන ලදී.

කිරි එකතු කිරීමේ ක්‍රියාවලිය ග්‍රාමීය මට්ටමෙන් ඉහළ නැංවීමේ අරමුණින් වසරෙහි අවසන් භාගයේදී කිරියා කිරි නිෂ්පාදන සමාගම විසින් " ස්වයං කළමනාකරණ ගොවි සමාජ " ඇති කරනු ලැබීය. මෙම කිරි එකතු කිරීමේ ක්‍රමය යටතේ ගොවීන් සපයනු ලබන කිරි වෙන වෙනම දෛනික පදනමකින් තත්ත්ව පරීක්ෂාවකට භාජනය කරනු ලැබූ අතර කිරි සඳහා ගෙවීම් කිරීමේදී කිරිවල අඩංගු මේද ප්‍රතිශතය සහ මේද නොවන ඝන ද්‍රව්‍ය පදනම් කර ගනු ලැබීය. මෙම ක්‍රමය කිරිවල ගුණාත්මක භාවය ඉහළ මට්ටමෙන් රැක ගැනීමට ඉවහල් වූ අතර, අතරමැදියන්ගෙන් තොරව සමාගමට කෙලින්ම කිරි සැපයීමට ගොවීන්ට හැකි වූ නිසා කිරි ගොවීන්ගේ ආදායම ඉහළ යාමටද හේතු විය.

දනට සමස්ත දේශීය කිරි සැපයුම රටෙහි පරිභෝජන අවශ්‍යතාවයෙන් සියයට 20 ත් 25 ත් අතර ප්‍රමාණයක් පමණක් බැවින් අතිරික්ත අවශ්‍යතාවය කිරිපිටි ස්වරූපයෙන් ආනයනය කරනු ලබයි. ඒ අනුව 1999 වසර තුළ කිරිපිටි මෙට්‍රික් ටොන් 54,000 ක් ආනයනය කළ අතර ඒ සඳහා වැය වූ මුදල රුපියල් දශ ලක්ෂ 7,118 ක් විය.

ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමේ අරමුණ පෙරදැරි කරගෙන දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා දේශීය ගව පට්ටිවල තත්ත්වය වැඩි දියුණු කිරීමටත්, ඒ සඳහා වඩාත් දියුණු පශු වෛද්‍ය සේවා යොද ගැනීමටත් ඇති හැකියාවන් පිළිබඳ සළකා බැලිය යුතුව ඇත.

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවලට අනුව වසරෙහි සමස්ත බිත්තර නිෂ්පාදනය දශ ලක්ෂ 898 ක් දක්වා සියයට 3 කින් වැඩි විය. සුළු පරිමාණ නිෂ්පාදකයින් මුහුණ දුන් ප්‍රධානතම ගැටළුව වූයේ කුකුල් කෑමවල මිළ ගණන් ඉහළ යාමයි. බිත්තරයක් සඳහා සාමාන්‍ය නිෂ්පාදන වියදම පසුගිය වසරට සාපේක්ෂව රු. 3.50 දක්වා සියයට 7 කින් වැඩි වූ බවට ඇස්තමේන්තු කර ඇත.

මෑත අතීතයේ සිට කුකුළු මස් නිෂ්පාදනය සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කළ අතර එය ජනතාවගේ ආහාරවේල සඳහා අවශ්‍ය සත්ව ප්‍රෝටීන් ලබා ගැනීමේ ජනප්‍රියතම මාධ්‍යය බවට සීඝ්‍රයෙන් පත් වෙමින් තිබේ. පශු සම්පත් සහ යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ඇස්තමේන්තුවලට අනුව ආනයන තරඟයට මුහුණ දීමේදී පාඩු ලැබූ සමහර නිෂ්පාදකයින් ස්වකීය සත්ව ගොවිපලවල් වසා දමූ තත්ත්වය තුළ වුවද, 1999 වසර තුළ කුකුළු මස් නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 57,000 ක් ලෙස වාර්තා වී ඇති අතර එය පසුගිය වසරට සාපේක්ෂව සියයට 10 ක වැඩි වීමකි.

කෘෂිකාර්මික ක්‍රියාවලිය තුළ පශු සම්පත් පාලනය අත්‍යාවශ්‍ය කොටසක් වන අතර මෙම අංශය කෘෂිකර්ම අමාත්‍යාංශයේ කාර්ය භාරයට ඇතුළත් කළයුතුව ඇත. ශෂ්‍ය කෘෂිකර්මය සහ පශු කෘෂිකර්මය යන අංශ දෙකම එකම අමාත්‍යාංශයක් තුළ ක්‍රියාත්මක වීමෙන් එකී අංශවල වඩාත් හොඳ සම්බන්ධීකරණයක් ගොඩ නැගෙනු ඇත.

## 3.6 යෙදවුම් සහ ණය

### පොහොර

1999 තුළදී පොහොර භාවිතය සියයට 9 කින් ඉහළ ගොස් මෙට්‍රික් ටොන් 612,000 ක් විය. පොහොර භාවිතය අනුව සැළකිය යුතු ඉහළ යාමක් වී වගා අංශය තුළ සියයට 25 කින් වර්ධනය වීමෙන් පෙන්නුම් කර ඇත. පොහොර භාවිතය සඳහා ගොවීන්ගේ ඉල්ලුම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වර්ෂය පුරාම වී සඳහා ආකර්ශනීය මිල ගණන් පැවතීම සහ වගාව යටතේ වූ ඇතැම් ප්‍රදේශවල ඉහළ වර්ධනයට හිතකර කාලගුණික තත්ත්වයක් පැවතීම වේ. පොල් වගා අංශය සඳහා වූ පොහොර නිකුත් කිරීමද මෙයට සමාන හේතූන් නිසාම සියයට 11 කින් ඉහළ ගියේය.

**3.9 සංඛ්‍යා සටහන**
**බෝග අනුව පොහොර භාවිතය**

මෙට්‍රික් ටොන් දහස්


| බෝගය | 1997 | 1998(අ) | 1999(ආ) |
|---|---|---|---|
| වී | 224 | 252 | 315 |
| තේ | 162 | 182 | 166 |
| රබර් | 12 | 16 | 11 |
| පොල් | 34 | 38 | 42 |
| අනෙකුත් ක්ෂේත්‍ර බෝග | 49 | 44 | 41 |
| අනෙකුත් අපනයන බෝග | 7 | 11 | 9 |
| අනෙකුත් | 20 | 19 | 28 |
| එකතුව | 508 | 561 | 612 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ජාතික පොහොර ලේකම් කාර්යාලය

තේ, රබර්, අනිකුත් ක්ෂේත්‍ර බෝග සහ අනිකුත් අපනයන බෝග සඳහා පොහොර භාවිතය පිළිවෙලින් සියයට 9 කින්, සියයට 3 කින් , සියයට 7 කින් සහ සියයට 18 කින් පහත වැටුණි. තේ හා රබර් සම්බන්ධයෙන් වර්ෂයේ පළමු භාගය තුළ පැවැති අයහපත් මිල ගණන් හේතුකොටගෙන විශේෂයෙන් කුඩා වගාකරුවන් පොහොර භාවිතය අඩු කළේය.

**3.6 රූප සටහන**
**ප්‍රධාන බෝග වර්ගවල පොහොර යෙදවුම්**




1997 සිට යූරියාවලට පමණක් සීමා වූ පොහොර සහනාධාරය මෙම වර්ෂය තුළදීද ක්‍රියාත්මක වූයේය. 1998 දී ජාතික පොහොර ලේකම් කාර්යාංශය මගින් ක්‍රියාත්මක කළ ගුණාත්මක පාලන වැඩසටහන වර්ෂය පුරාම ක්‍රියාත්මක වූයේය.

### බීජ

කෘෂිකාර්මික බෝගවල ඵලදායිතාවය ඉහළ නැංවීමේදී යෙදවුමක් ලෙස ගුණාත්මක වශයෙන් ඉහළ බීජ ඉතා වැදගත් වේ. මේ අනුව දේශීය වශයෙන් නිෂ්පාදිත සහ ආනයනය කරන ලද බීජ සහ රෝපන ද්‍රව්‍යවල ගුණාත්මක භාවය පාලනය කිරීම සඳහා බීජ සහතික කිරීමේ සේවාවට නීතිමය බලයක් ලබාදීමෙන් යෝජිත බීජ පනත මගින් වැදගත් කාර්යක් ඉටු කරනු ඇත. මෙම පනත මගින් බීජ සහ රෝපන ද්‍රව්‍ය සඳහා අවම ප්‍රමිතියක් නියම කෙරේ. එය ක්‍රියාත්මක කිරීමේ බලධරයා වන්නේ කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජෙනරාල්වරයාය. බීජ සහතික කිරීම ස්වේච්ඡාගත වුවද බීජ සහ රෝපණ ද්‍රව්‍ය අලෙවිකරණයේදී පණත අනුව සඳහන් කල අවම ගුණාත්මක ප්‍රමිතීන් පවත්වාගෙන යා යුතු වේ.

ජාතික බීජ ප්‍රතිපත්තියට අනුව ගුණනය කිරීමේ කටයුතු සඳහා උසස් තත්වයේ මූලික බීජ පෞද්ගලික අංශයේ බීජ නිෂ්පාදකයින්ට නිෂ්පාදනය කර බෙදා හැරීමේ වගකීම කෘෂිකාර්මික දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. ගොවීන්ට අඩු වියදම් බීජ අර්තාපල් සැපයුමේ අදහසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සීඝ්‍රව ගුණනය කිරීමේ තාක්‍ෂණය (Rapid Multiplication Technique) උපයෝගී කර ගනිමින් අර්තාපල් බීජ නිෂ්පාදනය සඳහා විශේෂ වැඩසටහනක් ආරම්භ කළේය. රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ සංවිධාන මගින් නිකුත් කළ බීජ නිෂ්පාදනය දළ වශයෙන් මෙට්‍රික් ටොන් 11,200 ක් වූ අතර මෙය ඉකුත් වර්ෂය හා සසඳනවිට සියයට 2 ක ඉහළ යාමකි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිකුත්කරන ලද අනෙකුත් ක්ෂේත්‍ර බෝග බීජ, එළවළු බීජ සහ අර්තාපල් බීජ පිළිවෙලින් සියයට 25 කින්, සියයට 38 කින් සහ සියයට 13 කින් ඉහළ ගියේය. පෞද්ගලික අංශයේ සමාගම් කීපයක්ද අනෙකුත් ක්ෂේත්‍ර බෝග සහ එළවළු බීජ නිෂ්පාදනයේ සහ අලෙවියේ නියුක්ත විය.

විදේශයන්ගෙන් හඳුන්වා දෙන ලද එළවළු බීජ ආනයනයේදී හා බෙදා හැරීමේදී පෞද්ගලික අංශයේ ආනයනකරුවන් ප්‍රධාන තැනක් ගත්තේය.

බතලගොඩ සහල් පර්යේෂණ සහ සංවර්ධන ආයතනය මගින් වර්ෂය තුළදී වැඩි දියුණු කළ නව සහල් ප්‍රභේද 4 ක් වාණිජ වගාවන් සඳහා ගොවීන්ට මුදා හරින ලදී. ඉන් එක ප්‍රභේදයක් මාස 3 ක කාලයක් සඳහා වූ අතර අනෙකුත් තුනම මාස 3 1/2 ප්‍රභේදයන් විය. ඉහළ අස්වනු ගෙන දෙන නව මැ ප්‍රභේදයක් වූ "කැප්පෙටිපොල නිල්" සහ ඉහළ අස්වනු ගෙන දෙන "ආරි" නම් මුං ඇට ප්‍රභේදයක්ද වර්ෂය තුළදී ගොවීන්ට මුදා හරින ලදී.

### කෘෂි රසායන ද්‍රව්‍ය

විවිධ රෝග සහ කෘමීන්ට ඔරොත්තු දෙන නව ඉහළ අස්වනු ගෙන දෙන ප්‍රභේදයන් හඳුන්වා දීමත් සමග කෘෂි රසායනික භාවිතය ජනප්‍රිය වූයේය. පලිබෝධ රෙජිස්ට්‍රාර්ගේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව කෘමිනාශක, දිලීර නාශක සහ වල් නාශක ඇතුළුව පලිබෝධ නාශක භාවිතය වර්ෂය තුළදී සියයට 13 කින් ඉහළ ගියේය. කෘමි නාශක භාවිතාකළ ප්‍රමාණය සියයට 25 කින් ඉහළ ගිය අතර දිලීර නාශක අලෙවිය සියයට 32 කින් ඉහළ ගියේය.

වල් නාශක භාවිතය අඩු කරලීමේ අරමුණින් යුතුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඒකාබද්ධ කෘමි පාලනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළේය. මෙම වැඩසටහන යටතේ වර්ෂය තුළදී ක්ෂේත්‍ර දින 235 ක් පවත්වන ලද අතර වී ගොවීන් 4,500 කට වැඩි ප්‍රමාණයක් පුහුණු කර ඇත. සමහර සූක්ෂම ලෙස වගා කළ එළවළු බිම්වල අවශ්‍ය ප්‍රමාණයට වඩා ඉහළ ප්‍රමාණයකින් පලිබෝධ නාශක භාවිතා කරන බැවින් මෙවැනි වැඩසටහනක් එළවළු සම්බන්ධයෙන්ද ක්‍රියාත්මක කිරීම වැදගත් වන්නේය.

#### ණය

ප්‍රාදේශීය සංවර්ධන බැංකු, රාජ්‍ය බැංකු සහ දේශීය පෞද්ගලික බැංකු නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ 1999 දී වගා ණය ප්‍රදානය පවත්වාගෙන ගියේය. එම යෝජනා ක්‍රමය යටතේ සියයට 12 ක පොලී අනුපාතයකට සහභාගිත්ව ණය දෙන ආයතනවල අරමුදල් සමග ණය මුදල් ගොවීන්ට ප්‍රදානය කළේය. රජය විසින් එම බැංකුවලට ප්‍රතිශතාංක 10 ක පොලී සහනාධාරයක් දෙනු ලබයි.

1998/99 වගා වර්ෂය තුළ ප්‍රදානය කළ මුළු ණය මුදල සියයට 1 කින් පහත වැටී රුපියල් දශ ලක්ෂ 463 ක් වූයේය. ප්‍රදානය කළ ණය මුදලින් සියයට 61 ක්ම මහ කන්නය තුළ වූ අතර එම මුදල රුපියල් දශ ලක්ෂ 281 ක් විය. යල කන්නය තුළ ප්‍රදානය කළ ණය මුදල රුපියල් දශ ලක්ෂ 182 ක් විය. පෙර වර්ෂයේදී මෙන් ණය මුදලින් ප්‍රධානතම කොටස වී ගොවීන් විසින් ලබා ගන්නා ලදී. එම මුදල මුළු ණය මුදලින් තුනෙන් දෙකක ණයක් වූ අතර රුපියල් දශ ලක්ෂ 318 ක් විය. යල කන්නයේ වී වගාව යටතේ වූ බිම් ප්‍රමාණය පසුගිය යල කන්නයට වඩා සියයට 26 කින් වැඩි වුවද, එම කන්නයේදී වී වගාව සඳහා ප්‍රදානය කළ ණය ප්‍රමාණය වැඩි වූයේ ආන්තික වශයෙනි. අතුරු ආහාර බෝග අංශය සඳහා වර්ෂය තුළදී ප්‍රදානය කළ ණය මුදල රුපියල් දශ ලක්ෂ 145 කි.

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කළ ණය මුදලින් වැඩිම ප්‍රමාණයක් රාජ්‍ය බැංකු විසින් ප්‍රදානය කළ අතර එය මුළු ප්‍රදානිත ණය මුදලින් සියයට 60 කට ආසන්න විය. නව සපිරි ණය යෝජනා ක්‍රමය යටතේ වර්ෂය තුළදී ගොවීහු 25,000 ක් පමණ ප්‍රතිලාභීහු වූහ. කෙසේ වෙතත් මෙය ගොවි ජනතාවගේ ණය අවශ්‍යතා වලින් කුඩා ප්‍රමාණයක් වූයේය. එයින් පෙන්නුම් කරනුයේ ගොවීන්ගේ විශාල ප්‍රතිශතයක් තවමත් ණය අවශ්‍යතා සඳහා ආයතනික නොවන මූලයන් මත රඳා පවතින බවයි.

## 3.7 වන සම්පත්

විදේශීය ණය දෙන ආයතනවල ආධාර ඇතිව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සංරක්ෂණය සහ පාරිසරික කළමනාකරණය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් වන සංරක්ෂණ හා අදාළ කටයුතු සඳහා ව්‍යාපෘති කිහිපයක් දියත් කරන ලදී. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මෙහෙයවීම යටතේ ආසියානු සංවර්ධන බැංකුව විසින් පස් අවුරුදු මෙහෙයුම් වැඩසටහන අනුව වන සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය නම් වූ වන සම්පත් පිළිබඳ මහා සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම සම්පූර්ණ කරන ලදී. මේ පිළිබඳව දෙපාර්ශවය අතර එකඟතාවය පිළිබඳ සංදේශයක් අත්සන් කරන ලදී. ඉහත ව්‍යාපෘතිය යටතේ වසර 2000 දී ආරම්භ වී අවුරුදු 7 ක් තුළ ක්‍රියාත්මක වන පරිදි එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 30 ක ණය මුදලක් ලැබීමට නියමිතය.

1999 වර්ෂය තුළදී ආසියානු සංවර්ධන බැංකුව සහ ඔස්ට්‍රේලියානු ආධාර අරමුදල් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 99 හා රුපියල් දශලක්ෂ 71 ක් සහභාගිත්ව වන සම්පත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සපයන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ 1999 වසර තුළදී පැල දශ ලක්ෂ 11 ක් නිෂ්පාදනය කළ අතර ගෙවතු වගා සංවර්ධනය (හෙක්ටයාර 4,948 ක්), ගොවි වන වගා කටයුතු (හෙක්ටයාර 2,566), ආරක්ෂිත වන වගා කට්ටි (හෙක්ටයාර 740) සහ විවිධ රුක් රෝපණ වැඩසටහන් මගින් වන වගාව ඉහළ නංවන ලදී. වනාන්තර ව්‍යාප්තිය යටතේ දශ ලක්ෂ 1.2 ක පැල රෝපණය කළ අතර බීජ කිලෝ ග්‍රෑම් 4,765 ක් එකතු කරන ලදී. වන සංරක්ෂණ කළමනාකරණය යටතේ 1999 වසර තුළදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හෙක්ටයාර 3,699 ක වන විද්‍යා ප්‍රතිකර්මයන්ද, හෙක්ටයාර 1,430 ක සමීක්ෂණ කටයුතුද, හෙක්ටයාර 1,973 ක කපාහෙලන ලද ගස් ලැයිස්තුගත කිරීමේ කටයුතුද නිම කරන ලදී.

1999 වසර තුළදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පාරිසරික කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ සිංහරාජ සහ නකල්ස් සංරක්ෂණ ව්‍යාපෘතිය සහ කඩොලාන සංරක්ෂණ ව්‍යාපෘතිය තවදුරටත් කරගෙන යන ලදී. සංරක්ෂක ප්‍රදේශ කළමනාකරණය, සංචිත කලාප කළමනාකරණය, ව්‍යාප්ත සේවා සහ දැනුවත් කිරීමේ වැඩසටහන්, පුහුණු වැඩසටහන්, ගොඩනැගිලි නඩත්තුව, මාවත් ඉදි කිරීම් සහ නඩත්තුව ආදී කටයුතු මෙම ව්‍යාපෘතිය යටතේ කරගෙන යනු ලැබීය. ඔසු පැල සංරක්ෂණ ව්‍යාපෘතිය යටතේ වන සම්පත් සහ අදාළ කටයුතු සඳහා ලෝක බැංකුවෙන් සහ විශ්ව පාරිසරික අරමුදලෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අරමුදල් ලැබුණි. මාතලේ, රත්නපුර, ගාල්ල, අනුරාධපුරය සහ මොණරාගල දිස්ත්‍රික්කවල ඔසු පැල සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

### 3.10 සංඛ්‍යා සටහන
### වන සම්පත් අංශය පිළිබඳ සංඛ්‍යා

| අයිතමය | ඒකකය | 1997 | 1998 (අ) | 1999 (ආ) |
|---|---|---|---|---|
| 1. මුළු වනාන්තර ප්‍රමාණය(ඇ) | හෙක්ටයාර දහස් | 2,119 | 2,119 | 2,119 |
| ඝන වනාන්තර(ඈ) | හෙක්ටයාර දහස් | 1,583 | 1,583 | 1,583 |
| ලඳු කැළෑ | හෙක්ටයාර දහස් | 464 | 464 | 464 |
| කඩොලාන | හෙක්ටයාර දහස් | 8,687 | 8,687 | 8,687 |
| 2. එළි කරන ලද වන බිම් ප්‍රමාණය(ඉ) | හෙක්ටයාර | 205 | 210 | ලැ.නො. |
| 3. නැවත වන වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර | 205 (ඊ) | 571 | 556 |
| 4. වාර්තා වූ වන නීති උල්ලංඝනය කිරීම් | සංඛ්‍යාව | 5,158 | 4,193 | 3,928 |
| දව ප්‍රමාණය | ඝන මීටර | 2,488 | 2,589 | 2,912 |
| දව වටිනාකම | රුපියල් දශලක්ෂ | 29.5 | 29.7 | 28.7 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) දළ වශයෙන් හෙක්ටයාර 72,350 ක ප්‍රයෝජනයට ගතහැකි වන වගාද අයත් වේ.
(ඈ) කඩොලාන ඇතුලත් වේ.
(ඉ) ඇස්තමේන්තු කළ
(ඊ) සහභාගිත්ව වන වගා ව්‍යාපෘති යටතේ ඇති වනාන්තර වපසරිය ඇතුලත් නොවේ.

මූලය : වන සම්පත් දෙපාර්තමේන්තුව

නීති විරෝධී ලෙස කපන ලද දැව ප්‍රමාණය ඝන මීටර් 2,912 දක්වා සියයට 12 කින් වැඩි විය. කෙසේ වෙතත්, 1999 වර්ෂය තුළදී වාර්තාවූ වන නීති උල්ලංඝනය කිරීමේ කටයුතු සංඛ්‍යාව 3,928 දක්වා සියයට 6 කින් අඩු විය.

නීති විරෝධී ලෙස දව කැපීම මර්ධනය කිරීම සඳහා දව ප්‍රවාහනය කිරීමේදී දැඩි නීති රීති ක්‍රියාත්මක කිරීම සහ දැඩි පරීක්ෂාවන්ට ලක් කිරීම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් සිදු කරගෙන යන ලදී.

## විශේෂ සටහන 3

# ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික රක්ෂණ කටයුතු නිදහස් කිරීම

දිවයින තුළ වී සහ අතිරේක ආහාර බෝග වගාව සහ සත්ව පාලනය සඳහා සපිරි රක්ෂණ ආවරණයක් ව්‍යාප්ත කිරීම වෙනුවෙන් 1973 දී කෘෂි රක්ෂණ මණ්ඩලය (කෘරම) පිහිටුවන ලදී. එවක් පටන් රක්ෂණ කටයුතු කෘෂි රක්ෂණ නීතිය (කෘරනී) යටතේ රජයේ ඒකාධිකාරයෙන් පැවතීමෙන් වී වගාව සම්බන්ධයෙන් කෘෂි රක්ෂණය ලබාදීමේ ඒකාධිකාරී බලය කෘෂි රක්ෂණ මණ්ඩලය වෙත ලැබුණි. වී වගාවේ නියුක්ත ගොවියෙකුට කෘෂි රක්ෂණ මණ්ඩලයෙන් රක්ෂණ ආවරණයක් ලබාගැනීම අනිවාර්ය කිරීමෙන් මෙම ඒකාධිකාරී බලය ලබාදී ඇත. අනෙකුත් බෝගයන් සහ සත්ව පාලනය සම්බන්ධයෙන් ස්වේච්ඡා පදනමක් යටතේ රක්ෂණ ආවරණය ලබාගැනීමට ගොවීන්ට ඉඩදී තිබුණි.

ඉකුත් වර්ෂයන්හිදී වී වගාව සඳහා කෘෂි රක්ෂණ මණ්ඩලය විසින් රක්ෂණ ආවරණය ලබාදුනි. නමුත් එකතු වන වාරිකයන්, හිමිකම් වන්දි ගෙවීම් සඳහා ප්‍රමාණවත් නොවන බැවින් මෙම හිඟය පියවීම සඳහා සැළකිය යුතු මුදල් ප්‍රමාණයක් මුදහැරීමට මහා භාණ්ඩාගාරයට සිදුවිය. මෙම අරමුදල් හිඟය නිසා කෘෂි රක්ෂණ මණ්ඩලයේ සේවාවන් ව්‍යාප්ත කිරීම බොහෝ දුරකට සීමා වුනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් හිමිකම් වන්දි ගෙවීම් තීරණය කිරීමේදී, තමන් සතුව පවත්නා සම්පත් එම වන්දි ගෙවීම් සඳමහා ප්‍රමාණවත් ද නැද්ද යන්න තීරණය කර ගැනීමට කෘෂි රක්ෂණ මණ්ඩලයට සිදුවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් තමන්ට ඇත්ත වශයෙන්ම සිදුවී ඇති බෝග හානිවීම්වලට වන්දි ගෙවීම් සඳහා රක්ෂිත ගොවීන්ට තම රක්ෂණ ආවරණය ප්‍රමාණවත් නොවන බැව් අවබෝධ විය.

අසූව දශකයේ මුල් කාලයේදී පෞද්ගලික අංශයේ රක්ෂණ සමාගම් සඳහා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරික කටයුතු විවෘත කෙරුණි. කෙසේ වුවත්, මෙම ලිහිල්කරණය සමග ඊට සමානුරූපීව කෘෂි රක්ෂණ අංශයේ ලිහිල්කරණයන් ක්‍රියාත්මක නොවීය. මෙහි ප්‍රතිඵලයක් ලෙස වී වගාව සම්බන්ධයෙන් ලැබී ඇති ඒකාධිකාරී බලය තවදුරටත් භුක්ති විඳීමට කෘෂි රක්ෂණ මණ්ඩලයට හැකිවිය. අනෙකුත් අතිරේක බෝගයන් සහ සත්ව පාලනය වෙනුවෙන් මෙබඳු සීමා පැනවීම් නොමැති වුවද කෘෂි රක්ෂණය සඳහා පෞද්ගලික රක්ෂණ සමාගම් ඇදී නොයාමට හේතුව එම අංශය සතුව පැවති ව්‍යාපාරික කටයුතුවල තිබූ අඩු පරිමාවයි. පෞද්ගලික අංශය සඳහා කෘෂි රක්ෂණය විවෘත කිරීමෙන් පසු එම කෙෂ්ත්‍රයේ තෝරාගත් ප්‍රදේශවල සීමිත රක්ෂණ යෝජනා ක්‍රමයක් ආරම්භ කොට ඇත්තේ එබඳු එක් සමාගමක් පමණක් බැව් වාර්තා වී තිබේ.

වී වගාව සඳහා කෘෂි රක්ෂණය, කෘෂි රක්ෂණ මණ්ඩලය මගින් ලබාදීම නිසා රජයේ අනුග්‍රහය ලද ණය යෝජනා ක්‍රමයන් යටතේ වී වගාව සඳහා ලබාදෙන ණය මුදල් වෙනුවෙන් සුරැකුම් වශයෙන් කෘෂි රක්ෂණ මණ්ඩලය විසින් පමණක් රක්ෂණ ඔප්පු පිළිගැනීමට ණය දෙන බැංකුවලට සිදු විය. අනෙකුත් බෝගයන් සහ සත්ව පාලනය සඳහා දෙන ණය මුදල් වෙනුවෙන් එබඳු සීමා පැනවීම් නොතිබිණ. නමුත් ණය මුදල් සඳහා සුරැකුම් වශයෙන් එබඳු ඔප්පු පිළිගැනීමට ණය දෙන බැංකුවලට අවස්ථාවක් නොලැබුණේ පෞද්ගලික රක්ෂණ සමාගම් කෙෂ්ත්‍රයට නොපිවිසීම නිසාය.

රට තුළ ශක්‍යතාවයෙන් යුතු තිරසාර බෝග රක්ෂණ අංශයක් පිහිටුවාලීම සඳහා ගොවීන්ට රක්ෂණ ඔප්පු ලබාගැනීමේදී පුළුල් තෝරා ගැනීමක් කිරීම සඳහා විවිධ රක්ෂණ සමාගම් අතර තරඟකාරීත්ව ප්‍රගුණ කිරීම අත්‍යවශ්‍ය වේ. එබැවින් වී වගාව සඳහා වූ බෝග රක්ෂණය වෙනුවෙන් පවත්නා කෘෂි රක්ෂණ නීතිය ප්‍රකාර කෘෂි රක්ෂණ මණ්ඩලය වෙත පැවරී ඇති මෙම ව්‍යවස්ථාපිත ඒකාධිකාරී බලය ඉවත් කළයුතු බැව් අවබෝධ විය.

අදාළ බලධාරීන් විසින් කරන ලද නිර්දේශයන් සැළකිල්ලට ගනිමින්, පසුව රජය විසින් කෘෂි රක්ෂණ මණ්ඩල පනත සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගෙන 1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත නමින් අභිනව නීතියක් නීතිගත කරන ලදී. පහත දක්වෙන පරමාර්ථයන් සාක්ෂාත් කර ගැනීම එම පනතේ අරමුණයි.

(අ) කෘෂිකාර්මික සහ උද්‍යාන බෝග, ඖෂධ පැලෑටි, සත්ව සම්පත්, ධීවර කටයුතු, වන වගාව, කෘෂිකාර්මික උපකරණ සහ මෙවලම්, කෘෂිකාර්මික සහ උද්‍යාන නිෂ්පාදන සහ ඖෂධ පැලෑටි, ධීවර හා වනාන්තර නිෂ්පාදන කල්පවත්වා ගැනීම සහ ගබඩා කිරීම වෙනුවෙන් රක්ෂණය සැපයීම සඳහා කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලයේ (කෘරම) විෂය පථය පුළුල් කිරීම.

(ආ වගාකරුවන් සඳහා සමාජ සුරැකුම් යෝජනා ක්‍රමයන් සහ වෛද්‍ය ප්‍රතිලාභ ලබාදීම සහ,

(ඇ) බෝග රක්ෂණය සැළැස්වීමට පෞද්ගලික රක්ෂණයන්ට ඉඩ ප්‍රස්ථා ලබාදෙමින් 1973 අංක 27 දරණ කෘෂි රක්ෂණ නීතිය අහෝසි කිරීම.

කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පණත 1999 අගෝස්තු 16 දින සිට ක්‍රියාත්මක වීමත් සමග කෘෂි රක්ෂණ මණ්ඩලය (කෘරම) වෙත පවරා ඇත. තවද, අභිනව පණත මගින් කෘෂි රක්ෂණයට අදළව පැවති කෘෂි රක්ෂණ මණ්ඩලයේ ඒකාධිකාරීත්වයට අවසර දී නොමැති බැවින් මෙම අංශයේ නියැලී අනෙකුත් රක්ෂණ සමාගම්වලට කෘෂි රක්ෂණයට ප්‍රවිෂ්ට වීමට ඉඩ ලබාදී ඇත.

මෙම ක්‍රියාමාර්ගයේ ප්‍රතිඵලයක් වශයෙන් තමන්ගේ අභිමතය පරිදි කෘෂි රක්ෂණය ලබාගැනීමට ගොවීන්ට දැන් හැකි වී ඇත.